# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 7 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 7 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

**කතෝලික ධර්මය**

**7 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2016**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN: .....................

**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

**මුද්‍රණය :**

**මුද්‍රණාලය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** :
- අධ්‍යාපනපති ගරු කාල්ටන් ද සිල්වා පියතුමා
  කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ශාස්ත්‍රපති ගරු එස්. අනුයාස් ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය**

- අධ්‍යාපනපති හා සාමාජීය විද්‍යාපති ගරු ජූඩ් දසනායක පියතුමා
  (කථිකාචාර්ය, බිංගිරිය විද්‍යාපීඨය)
- ශාස්ත්‍රපති එස්. ජී. කේ. ඩී. එල්. සී. ප්‍රසාද් මහතා
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී දුෂ්මන්ති දයා කුමාරි ද සිල්වා මෙනෙවිය
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මීනුවන්ගොඩ)
- ඩී. අයි. ජෝසප් මෙනෙවිය
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ)
- ශාස්ත්‍රපති ඇන් නිශාන්ති රත්නසිංහ මෙනෙවිය
  (ගුරු සේවය, සාන්ත ජෝසප් බාලිකා විදුහල, නුගේගොඩ)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී ටී. අයි. රන්ගනායගම් මහතා
  (ගුරු සේවය, ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය, කොළඹ 03)
- ශාස්ත්‍රවේදී ටී. ජේ. පෝල් ඇන්තනි මහත්මිය
  (විශ්‍රාමික විදුහල්පතිනිය)

**කතෝලික උපදේශක මණ්ඩලය**

- අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා රදගුරුතුමා
  සභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිඋතුම් ජෝශප් පොන්නයියා රදගුරුතුමා
  උපසභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිගරු අයිවන් පෙරේරා පියතුමා, කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා, බයිබල් හා ධර්මෝපදේශ පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ආචාර්ය ගරු හෙන්රි සිල්වා පියතුමා, කථිකාචාර්ය, ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
- ආචාර්ය ගරු ඥාණමුත්තු හෙක්ටර් පිලේන්ද්‍රන් පියතුමා, අංශ ප්‍රධාන, බටහිර සම්භාව්‍ය සංස්කෘතික හා ක්‍රිස්තියානි හා ඉස්ලාමීය සංස්කෘතික දෙපාර්තමේන්තුව, යාපනය විශ්වවිද්‍යාලය
- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා, සහකාර අධ්‍යක්ෂ, ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් සැකසුම**

මංගලිකා විජේරත්න මහත්මිය, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබා ගැනීම පමණක් නොසෑහේ. දැනුම පමණක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය තුළින් ආවේදන නොවරදීම තීව්‍ර කර, කුසලතා අනිවාර්යයෙන් ම ඔපමට්ටම් කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළපොත මෙම ගුරු මාර්ගෝපදේශයට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිත ය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී :

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව, නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ පෙරාතුව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදුකිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරුභවතා පංති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**කථිකාචාර්ය, ගරු කාල්ටන් ද සිල්වා පියතුමා**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශය | vi - xxiii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 60 |
| විවිධ සහාය | 61 |

# විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

ආගම යනු ජීවිතය යි. එහෙයින් ජීවිතයෙන් ආගම වෙන් කළ නොහැකි ය. සෑම ආගමක ම පරමාර්ථය සදාචාරසම්පන්න ගුණගරුක සමාජයක් ගොඩනැගීම යි. එම අරමුණත් පෙරදැරි කර ගෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අතර එහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ සිසුන් තුළ නිපුණතා ගොඩනැගීම යි. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී කරගත් ජීවිත පුරුද්දකි. අධ්‍යාපන දාර්ශනිකයන් අන්තර් පුද්ගල හැකියා යනුවෙන් අර්ථ දක්වනුයේ වෙන කිසිවක් නොව කිතුනු අප "ප්‍රේමය" යනුවෙන් හඳුන්වනු ලබන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මූලික ඉගැන්වීම යි. එබැවින් උත්තම ගුරු දේවයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ හා ශුද්ධ වූ කතෝලික සභා ඉගැන්වීම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා, කිතුනු ආකල්ප සංවර්ධනය කර ගෙන, කුසලතාවලින් පරිපූර්ණ වී, ප්‍රේමය මත ගොඩනැගුණු ජීවිත පුරුද්දක් ඇති කිරීම කතෝලික විෂයයෙහි මෙම නව සංස්කරණ මගින් ඉලක්ක කෙරේ.

කිතුනු ඉගැන්වීම්වල පදනම ශුද්ධ බයිබලය යි. මන්ද යත් කිතුනු විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය ශුද්ධ බයිබලීය ඉගැන්වීම් මත පදනම් වී ඇත. එබැවින් මෙම කතෝලික විෂය නිර්දේශයෙහි පළමු තේමාව වන්නේ ශුද්ධ බයිබලය යි. තව ද ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා විසින් නිර්දේශිත විශේෂ කමිටුවක් විසින් සම්පාදනය කරනු ලැබූ "කතෝලික සභා ධර්මෝපදේශය" (Catechism of the Catholic Church) නමැති ග්‍රන්ථයෙහි තේමාවන්ට අනුකූල ව ඉතිරි තේමා හතර ගොනුකර ඇත. ඒ අනුව මෙම විෂය නිර්දේශයේ පහත සඳහන් තේමා පහ ඇතුළත් කර ඇත.

1. ශුද්ධ බයිබලය
2. ත්‍රිත්වික දෙවියන් වහන්සේ
3. විශ්වාසයේ ජීවිතයට ශක්තිය
4. විශ්වාසයේ ජීවිතය ක්‍රියාත්මක කිරීම
5. යාච්ඤාවේ ජීවිතය

එම තේමා පහ අනුව නිපුණතා පහක් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා විෂය නිර්දේශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

කතෝලික විෂය නිර්දේශයේ දක්වා ඇති නිපුණතා සාක්ෂාත් කර ගනිමින් අනාගතයේ දී වැඩිහිටි කතෝලික නිපුණයෙකු ලෙස ක්‍රියාකාරී වීමට වර්තමාන දරුවා ගොඩනැගීම අවශ්‍ය වේ. ඒ සඳහා 6-9 ශ්‍රේණිවල දී මූලික ජීවිත පුරුද්දක් ඇති කර 10-11 ශ්‍රේණිවල දී පූර්ණ කතෝලික බැතිමතෙකු ලෙස තිබිය යුතු නිපුණතා ගොඩනැගීම මෙයින් අපේක්ෂා කෙරේ. මන්ද 12-13 ශ්‍රේණිවල කලා විෂය ධාරාවෙන් ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය තෝරා ගන්නා අතළොස්සක් හැර ඉතිරි කතෝලික බහුතරයේ ආගමික දැනුම අ.පො.ස. (සා.පෙළ) විෂය නිර්දේශයට බොහෝවිට සීමා වන බැවිනි.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින්, අදාළ නිපුණතා සිසුන් තුළ ගොඩනැගීමට ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම, සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරන ගුරුවරයාගේ වගකීම යි.

ආගම විෂය උගන්වන ගුරුවරයා විශේෂයෙන් එම ධර්මතා පිළිඹිබු කරන කැඩපතක් විය යුතු ය. එහෙයින් පළමු ව ගුරුවරයා සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන, ආගමික සංකල්ප තමන් තුළ ප්‍රගුණ කරගත් පුද්ගලයෙකු බව ශිෂ්‍යයාට අවබෝධ විය යුතු ය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** — සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** — පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

1. තම ජීවිතය ගොඩනගා ගැනීමට ශුද්ධ බයිබලය පිටිවහලක් කර ගනියි.

2. මැවිල්ලේ උතුම් ම මැවිල්ල වන මනුෂ්‍යයාගේ මැවුම්කරුවාණන්, දෙවියන් වහන්සේ බව හඳුනා ගනියි.

3. ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්ය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිණත කිතුනු ජීවිතයක් ගත කරයි.

4. දේව වාක්‍යය, දේව ප්‍රසාද නිධාන හා ජනවන්දනාව තුළින් පෝෂණය ලබා සමාජය තුළ සාක්ෂි දරයි.

5. ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එක ම ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනියි.

6. දේව පනත් හා කන්ද උඩ දේශනය තුළ ගැබ් ව ඇති කිතුනු සදාචාරමය ඉගැන්වීම් පදනම් කරගෙන ජීවත් වෙයි.

7. යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී දේව වරප්‍රසාද අත්දකියි.

8. ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට ක්‍රියා කරයි.

9. තමා අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයක් බව පිළිගෙන එය සුරැකීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කර ගනියි.

10. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගා ගෙන, කිතුනු අනන්‍යතාව තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහිකරලීමට දායක වෙයි.

11. කිතුනු විශ්වාසය රැක ගනිමින්, සෑම ආගමකට ම ගරු කිරීමට පුරුදු වෙයි.

12. ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කර ගනියි.

## විෂය අදාළ නිපුණතා

1. ශුද්ධ බයිබලය පිළිබඳ ව අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

3. දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

4. දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

5. යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 ශුද්ධ බයිබලය පිළිබඳ ව අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි. | **7.1.1 දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරයි.** | **01 පාඩම දිවැසිවරු**<br>• හැඳින්වීම<br>• නබී සහ ප්‍රොෆෙටේස් යන වචනවල අර්ථ<br>• දිවැසිවරයෙක් යනු<br>• වර්ගීකරණය<br>1 දේශක (නාතාන්, එලියා, එලීෂා)<br>2. ලේඛක<br>i ප්‍රධාන 3<br>ii. සුළු 12 | • ඉශ්‍රායෙල් දිවැසිවරු පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේව හඬට සවන් දිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දෙවියන් වහන්සේ වෙනුවෙන් හඬ නගයි.<br>• දේව පණිවිඩයට ප්‍රතිචාර දැක්වීමට අන් අය යොමු කරවයි. | 02 |
| | **7.1.2 අන් අයට දේව වචනය ප්‍රකාශ කරයි.** | **02 පාඩම දේශක දිවැසිවරු**<br>• නාතාන්, එලියා හා එලීෂා පිළිබඳ කෙටි අධ්‍යයනයක් | • දේශක දිවැසිවරු පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දිව්‍ය සංරක්ෂණය පතා දිනපතා යාච්ඤා කරයි.<br>• අන් අය ව යහපත් දිවි පෙවෙතකට යොමු කරවයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **7.1.3 දේව කැඳවීමට ප්‍රතිචාර දක්වයි.** | **03 පාඩම ප්‍රධාන දිවැසිවරු**<br>• තිදෙනා පිළිබඳ ව කෙටි හැඳින්වීමක්<br>• යෙසායාගේ කැඳවීම | • ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේවස්ථානයේ ගරුත්වය ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• නායකත්වයේ වගකීම් වගවීමෙන් ඉටු කරයි.<br>• වගකීම් ඉටු කරමින් අන් අයට සේවය කරයි. | 02 |
| | **7.1.4 කාලයේ සලකුණු අනුව දිවැසිවර කාර්යයේ නියැලෙයි.** | **04 පාඩම සුලු දිවැසිවරු**<br>• ආමොස්, හොසියා හා ජෝනා පිළිබඳ කෙටි හැඳින්වීමක් | • ආමොස්, හොසියා හා ජෝනා යන සුළු දිවැසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සාධාරණත්වය වෙනුවෙන් හඬ නැගිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරයි.<br>• අන් අය ව මනස්තාපනයට යොමු කරවයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි. | **7.2.1 දේව කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේ දී ජීවිත වෙනසක් ඇති කර ගනියි.** | **05 පාඩම ආබ්‍රහම් තුමාගේ කැඳවීම** (උත්පත්ති 12/1-9)<br>• කැඳවීමේ අංග 2කි<br>1. පරිත්‍යාගය<br>2. අභියෝග<br>• පරිත්‍යාග 3<br>1. මව්බිම<br>2. නෑදෑයෝ<br>3. පියාගේ ගෘහය<br>• අභියෝග 3<br>1. මහත් ජාතියක් වීම<br>2. සංචාරක ජීවිතයක්<br>3. නොදන්නා දේශයකට යාම<br>• පොරොන්දු 2 කි<br>1. දේශයක් දීම<br>2. මහත් ජාතියක් වීම | • ආබ්‍රහම් තුමාගේ කැඳවීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• අභියෝගවලට නිර්භය ව මුහුණ දිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• තම කැඳවීම්වලට කීකරු වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය ලබා දෙයි. | 02 |
| | **7.2.2 සැමවිට ගිවිසුම් ජීවිතයට විශ්වාසවන්ත වෙයි.** | **6 පාඩම ආබ්‍රහම් තුමා සමග ගිවිසුම** (උත්පත්ති 15/1-21, 17/1-14)<br>• ගිවිසුමේ වැදගත් කරුණු 2<br>1. අංසඛ්‍ය වූ දරු පරපුරක් (උත්පත්ති 15/5, 17/5)<br>2. සදාකාලයට ම හිමි වන දේශයක් (උත්පත්ති 15/21, 17/8)<br>• ගිවිසුම කළ ආකාරය<br>• ගිවිසුමේ ලකුණ (චර්මච් ඡේදනය)<br>• ආබ්‍රහම් තුමාගේ නම වෙනස් කිරීම හා එම නම්වල අර්ථ (උත්පත්ති 17/5) | • ආබ්‍රහම් තුමා සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ප්‍රසාද ස්නාපනයේ දී ගිවිසුම් ජීවිතයට බැඳෙන බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සැමවිට ගිවිසුම් ජීවිතයට විශ්වාසවන්ත වෙයි.<br>• අන් අයට දුන් පොරොන්දු ඉටු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **7.2.3 දෙමාපියන්ට කීකරු යහපත් දරුවෙක් වෙයි.** | **7 පාඩම ඊසාක් තුමා**<br>• උපත (උත්පත්ති 21/1-8)<br>• ඊසාක් පූජා කරනු ලැබීම (උත්පත්ති 22/1-19)<br>• ඊසාක් මගින් ගිවිසුම අලුත් කිරීම (උත්පත්ති 26/19-25)<br>• ඊසාක්ගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ | • ඊසාක් තුමා පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• අන් අය සමග සාමයෙන් විසිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දෙමාපියන්ට කීකරු යහපත් දරුවෙක් වෙයි.<br>• සහයෝගයෙන් ක්‍රියා කරයි. | 02 |
| | **7.2.4 සහෝදරයා සමග සමගියෙන් ජීවත් වෙයි.** | **8 පාඩම ජාකොබ් තුමා**<br>• උපත (උත්පත්ති 25/19-26)<br>• බෙතෙල්හි දර්ශනය (ගිවිසුම අලුත් කිරීම) (උත්පත්ති 28/10-22)<br>• පෙනුයෙල්හි දර්ශනය (උත්පත්ති 32/24-30)<br>• ඒසව් සමග සමගි වීම (උත්පත්ති 33/1-3) | • ජාකොබ් තුමා ගැන කරුණු ගොනු කරයි.<br>• සහෝදරයන් සමග සමගියෙන් ජීවත් විය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව හඬට ප්‍රතිචාර දක්වයි.<br>• අන් අය සමග සමගියෙන් ජීවත් වෙයි. | 02 |
| | **7.2.5 එදිනෙදා ජීවිතයේ ලැබෙන කැඳවීම්වලට නිසි ප්‍රතිචාර දක්වයි.** | **9 පාඩම අපෝස්තුලුවරුන්ගේ කැඳවීම**<br>• ධීවරයන් හතර දෙනා කැඳවීම (මතෙව් 4/18-22)<br>• මතෙව් තුමාගේ කැඳවීම (මතෙව් 9/9-13)<br>• අපෝස්තුලුවරු දොළොස්දෙනාගේ නම් (මතෙව් 10/2-4)<br>• ජුදාස් වෙනුවට මතියස් තුමා පත්කර ගැනීම (ක්‍රියා 1/12-26)<br>• ධර්මදූත වගකීම් පැවරීම (මතෙව් 28/19-20) | • අපෝස්තුලුවරුන් කැඳවීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• තම කැඳවීම්වලට නිසි ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව වචනය කියවා මෙනෙහි කරයි.<br>• දේව වචනයට සවන්දීමේ වැදගත්කම පහදා දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි. | **7.3.1 ප්‍රසාද ස්නාපන පිළිවෙතට අවබෝධයෙන් යුතු ව සහභාගී වෙයි.** | **10 පාඩම ප්‍රසාද ස්නාපනය**<br>• පිළිවෙත සරල ව හඳුන්වා දීම (ළමා ප්‍රසාද ස්නාපන පිළිවෙත)<br>• ඒ පිළිබඳ ව ඇති ශුද්ධ වූ සභා නීති (ශාසන නීතිය 857, 862, 865, 867/1, 868/1, 872) | • ප්‍රසාද ස්නාපනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ප්‍රසාද ස්නාපනය මගින් නව ජීවිතයක් ලැබෙන බව පිළිගනියි.<br>• ළදරුවන්ට ප්‍රසාද ස්නාපනය දානය කරන පිළිවෙත රඟ දක්වයි.<br>• ප්‍රසාද ස්නාපනය දානය කරන පිළිවෙතට අර්ථවත් ව සහභාගි වෙයි.<br>• ප්‍රසාද ස්නාපන පිළිවෙත්වල දී අර්ථවත් කිරීමට සහාය වෙයි. | 02 |
| | **7.3.2 ජනතාව ශුද්ධවත් කරන පියතුමන්ලා වෙනුවෙන් යාච්ඤා කරයි.** | **11 පාඩම පූජකවරය**<br>• ධූර 3 (තේවාචාරී, පූජක, රාජගුරු)<br>• එක් එක් ධූරයට පැවරෙන වගකීම්<br>• පදවි හා පැවිදි ලෙස පූජකවරු කොටස් දෙකකි.<br>• පදවි පූජකවරු, රදගුරුතුමා යටතේ<br>• පැවිදි පූජකවරු, පැවිදි නිකායේ ශ්‍රේෂ්ඨාධිපති යටතේ<br>• පදවි පූජකතුමන්ලාගේ පොරොන්දු දෙක<br>1. කීකරුකම<br>2. පූජක බඹසර<br>• පැවිදි අය වේදහාර තුන<br>1. කීකරුකම 2. ව්‍රත ශුද්ධිය 3. දිළිඳුකම | • පූජකවරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• පූජක සේවාව අගය කරයි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පූජාප්‍රසාදිවරුන් වෙනුවෙන් යාච්ඤා කරයි.<br>• පූජාප්‍රසාදිවරුන්ගේ සේවයට සහාය වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3.3 පැවිදි ජීවිතය අගය කරයි. | **12 පාඩම පැවිදි දිවිය**<br>• කොටස් දෙකකි.<br>- පැවිදි පූජක<br>- පූජක නොවන පැවිදි අය<br>• පැවිදි පූජක උදාහරණ නි.ම.නි., ජේසු නිකාය, බෙනඩික්ටාන පියතුමන්ලා, දිව්‍ය සත්ප්‍රසාද නිකාය<br>• පූජක නොවන පැවිදි අය කොටස් දෙකකි.<br>1. පැවිදි සොයුරන් (මාරිස්ට්, ද ලා සාල්)<br>2. පැවිදි සොයුරියන් (ශුද්ධ වූ පවුලේ, අපෝස්තලික කාර්මෙල්, යහපත් එඬේරා, සුරදූත, දිව්‍ය ගැලවුම්කරුවාණන්, සිරි කුරුස, ඩොමිනිකාන)<br>• මේ සියලු දෙනා වේදභාර ගනියි.<br>• ස්වර්ගයේ කිරීටය දිනා ගැනීමට වෙහෙසෙයි. (1කොරින්ති 9/24 - 27) | • පැවිදි ජීවිතය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• පැවිදි ජීවිතය දෙවියන් වහන්සේගේ කැඳවීමක් බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පැවිදි ජීවිතය අගය කරයි.<br>• පැවිදිවරුන්ගේ සේවාවන්ට සහාය වෙයි. | 02 |
| | 7.3.4 ගිහි ධර්මදූත සමිතියක ක්‍රියාකාරී සාමාජිකයෙක් වෙයි | **13 පාඩම ගිහි කැඳවීම**<br>• පොදු පූජකවරය හා නිල පූජකවරය<br>• පොදු පූජකවරය, ප්‍රසාද ස්නාපනයෙන්<br>• නිල පූජකවරය, පූජකවරයෙන්<br>• පොදු පූජකවරය මගින් ලැබෙන දිවැසිවර, පූජක හා එඬේරික කාර්යයන්<br>• දරුවන් වශයෙන් නිරත විය හැකි දිවැසිවර, පූජක හා එඬේරික කාර්යයන්<br>• මෙම කාර්යයන් ඵලදායී ව ඉටු කිරීමට සහාය වන සමිති සමාගම් | • පොදු පූජකවරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• පොදු පූජකවරයන් පැවරෙන වගකීම් භාර ගැනීමට කැමැත්ත පල කරයි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• මීසමේ ධර්මදූත කාර්යයන්ට උනන්දුවෙන් සහභාගි වෙයි.<br>• මීසමේ සමිති සමාගම්වලට දායක වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **7.3.5 ශුද්ධ වූ පවුලේ ආදර්ශය තුළ ජීවත් වෙයි.** | **14 පාඩම ආශිර්වාදකාර බන්ධනය**<br>• කිතුනු විවාහයේ ලක්ෂණ<br>1. ඒකත්වය (එක් ස්වාමි පුරුෂයෙකුට එක් භාර්යාවක් ද එක් භාර්යාවකට එක් ස්වාමි පුරුෂයෙකුත් පමණි)<br>2. අඛණ්ඩභාවය (දික්කසාදයක් නැත)<br>• දෙමාපියන්ගේ යුතුකම්<br>• නාසරතයේ ශුද්ධ වූ පවුලෙන් ලබා ගත හැකි ආදර්ශයන් | • ආශිර්වාදකාර බන්ධනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ශුද්ධ වූ පවුලෙන් ආදර්ශ ගත යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ආදර්ශමත් පවුලක් ලෙස ජීවත් වෙයි.<br>• දෙමව්පියන්ගේ කටයුතුවලට සහාය වෙයි. | 02 |
| 4.0 දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි. | **7.4.1 තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරයි.** | **15 පාඩම මව්පියන්ට සංග්‍රහ කරමු.**<br>• දස පනතේ දෙවන කොටසේ පළමු පනත<br>• පණිවිඩය දෙවියන් වහන්සේ ට පසු ව අප වැඩිපුර ම ප්‍රේම කළ යුත්තේ දෙමාපියන්ට<br>• හේතුව - දෙවියන් වහන්සේගෙන් ලැබෙන ජීවිතය හා විශ්වාසය අපට ලැබී ඇත්තේ දෙමාපියන්ගෙන්<br>• ආදරය කිරීම හා කීකරුවීම<br>• මෙම පනතින් කීකරු වීමට නියම කෙරෙන වෙනත් අය (ආගමික නායකයන්, රාජ්‍ය නායකයන්, ගුරුවරුන්, වැඩිහිටියන්)<br>• දෙමාපියන්, මීසම, පාසල හා රට යනාදිය වෙනුවෙන් යුතුකම් | • 4වන පනත පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• පාසල වෙනුවෙන් තම යුතුකම් නිසිලෙස ඉටු කළ යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දෙමාපියන්ට කීකරු ව ජීවත් වෙයි.<br>• වැඩිහිටියන්ට ගරු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **7.4.2 සත්‍ය ගරුක පුද්ගලයෙක් වෙයි.** | **16 පාඩම බොරු සාක්ෂි නොකියව**<br>• අනනියස් හා සපිරා පිළිබඳ සිද්ධිය (ක්‍රියා 5/1-11)<br>• මතෙව් 15/10-12, 15-20<br>• එපීස 4/25<br>• ක.ස.ධ. 2465<br>• ජොහන් 8/44 | • සත්‍යගරුක සමාජයක් ගොඩනැගීම සඳහා දායක විය හැකි ආකාර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සත්‍යය තුළ ජීවත් වීමේ දී හෘදය සාක්ෂියට කතා කිරීමට නිතර ම ඉඩදිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• බොරු කීම අතහැර සත්‍යය කතා කරයි.<br>• සමාජය තුළ එකිනෙකාට අවංක වෙයි. | 02 |
| | **7.4.3 අන් අයගේ දේපළ ආරක්ෂා කරයි.** | **17 පාඩම සොරකම් නොකරව**<br>• 7වන පනතින් තහනම් වනුයේ සොරකම් කිරීම, බලහත්කාරයෙන් ගැනීම, අසාධාරණයෙන් ගැනීම හා අන් සතු දේපළ විනාශ කිරීම<br>• වස්තුව ඉපැයිය හැකි සාධාරණ ක්‍රම (අවංක මාර්ග) (වැඩ කිරීමෙන්, මිලට ගැනීමෙන්, හුවමාරු කර ගැනීමෙන්, තෑගි හා උරුම වශයෙන් ලැබීම)<br>• ප්‍රයෝග, වංචනික ක්‍රියා හා අල්ලස් ගැනීම් මගින් සොරකම සිදුවන බව | • 7වන පනතට අනුව ජීවත් විය යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• අවංක මාර්ගවලින් පමණක් වස්තුව ඉපැයිය හැකි බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සොරකම් කිරීමෙන් වැළකී සිටියි.<br>• අන් අයගේ දේපල ආරක්ෂා කරයි. | 02 |
| | **7.4.4 ලද දෙයින් සතුටු වෙයි.** | **18 පාඩම අන් වස්තු ආශා නොකරව**<br>• 7වන පනතින් බාහිර ක්‍රියාව ගැන<br>• 10වන පනත අනුව තණ්හාව උපදවා ගැනීම පවා පාපයක්<br>• තණ්හා සිතුවිලි ක්‍රියාවට පෙරලෙයි (මීකා 2/1-2)<br>• තණ්හාව මුල් අගුණ පාපයකි (ක.ස.ධ. 2534 - 2540) | • 10වන පනතට අනුව ජීවත් විය යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• තණ්හා සිතුවිලි ක්‍රියාවට පෙරලෙන බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ලද දෙයින් සතුටු වෙයි.<br>• අන් අයගේ දේපළ ආරක්ෂා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි. | **7.5.1 නිවැරදි ව බැතියෙන් ජපමාලය උච්චාරණය කරයි.** | **19 පාඩම ජපමාල බැතිය**<br>• ඉතිහාසය<br>• අභිරහස් 20 හා අදාළ දින<br>• ජපමාලය කියන අනුපිළිවෙල හා එයට අදාළ යාච්ඤා (අහෝ මාගේ ජේසුනි, සකල ගුණ සම්පන්න, මංගල්‍යස්තු රාජේස්වරියනි යන යාච්ඤා කට පාඩම් කිරීමට යොමු කරවන්න)<br>• මළවුන්ගේ ජපමාලය<br>• විවිධ ප්‍රාර්ථනා හඳුන්වා දීම (අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රාර්ථනාව, සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ ප්‍රාර්ථනාව, සාන්ත ජූඩ් මුනිඳුන්ගේ ප්‍රාර්ථනාව) | • ජපමාලය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ජපමාල බැතිය අප ජීවිත ආරක්ෂා කරන බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පවුලක් ලෙස දිනපතා ජපමාලය උච්චාරණය කරයි.<br>• ජපමාල බැතිය සම්බන්ධයෙන් මීසමේ ඇති වැඩ සටහන්වලට උද්යෝගයෙන් සහභාගි වෙයි. | 02 |
| | **7.5.2 ඵලදායි ලෙස දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සමරයි.** | **20 පාඩම නුවාන හා මංගල්‍යය**<br>• දින 10ක රාමුවේ පසුබිම<br>• දේවස්ථානය කැප කළ ශුද්ධවන්තයා පිළිබඳ අවබෝධය<br>• දේවස්ථාන මංගල්‍ය පැවැත්වීමේ අර්ථය<br>• කොඩි ගස එසවීමේ අරුත<br>• මංගල්‍යය සමයේ දී ආධ්‍යාත්මික දේවලට මුල්තැන දීම<br>• නුවාන දිනවල දී දේව වචනය මෙනෙහි කිරීමට මූලිකත්වය දිය යුතු බව<br>• ඇදහිල්ලෙන් හා භක්තියෙන් පෙරහැරට සහභාගී වීම<br>• මංගල්‍යය සමයේ දී කරන දානමය ක්‍රියා ඉතා අර්ථවත් ව කළ යුතු බව<br>• සැබෑ පසුතැවිල්ලක් සඳහා මෙම කාලය භාවිත කළ යුතු බව<br>• ශුද්ධවන්තයාගේ මැදිහත්කම තුළ අපට වරප්‍රසාද ලැබෙන බව | • දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේවස්ථානයේ මංගල සමය සැබෑ ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගත යුතු කාලවකවානුවක් ලෙස පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• මංගල සමයේ තම ජීවිතයේ ආධ්‍යාත්මික වර්ධනයක් ඇති කර ගනියි.<br>• මංගල සමයේ මීසමේ පොදු කටයුතුවල දී සහයෝගය ලබා දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **7.5.3 ගෞරවයෙන් සන්ධ්‍යා මෙහෙයට සහභාගී වෙයි.** | **21 පාඩම සන්ධ්‍යා මෙහෙය හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය**<br>• යාම යැදුම පිළිබඳ ව කෙටි හැඳින්වීමක්<br>• සන්ධ්‍යා මෙහෙයේ සැලැස්ම<br>• දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පවත්වන අවස්ථා | • සන්ධ්‍යා මෙහෙය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ගෞරවාන්විත ව සන්ධ්‍යා මෙහෙයට සහභාගි විය යුතු බව පිළිගනියි.<br>• සන්ධ්‍යා මෙහෙයේ සැලැස්ම නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගනිමින් දෙවිඳුන් හා ගැඹුරු සබඳතාවක් ගොඩනගා ගනියි.<br>• සන්ධ්‍යා මෙහෙය කටයුතු සංවිධානයේ දී මීසම්වාසීන් හා සහයෝගයෙන් ක්‍රියා කරයි. | 02 |
| | **7.5.4 පැමිණෙන දුක්වේදනා දරා ගැනීමට ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය පිටිවහලක් කර ගනියි.** | **22 පාඩම පාද නමස්කාරය**<br>• ඉතිහාසය කෙටියෙන්<br>• ස්ථාන 14 පිළිබඳ හැඳින්වීම<br>• එක් එක් ස්ථානයේ අනුපිළිවෙල<br>• පාද නමස්කාරයේ දී අවශ්‍ය වන පිළිතුරු හා දේව කන්‍යා ගීතිකාව | • පාද නමස්කාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• පාද නමස්කාරයට සහභාගිවීම තුළ ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සහභාගි විය හැකි බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• චතාරික සමය තුළ හැකි සෑමවිට ම පාද නමස්කාරයට භක්තියෙන් සහභාගි වෙයි.<br>• පාද නමස්කාරය සංවිධානය කිරීමට දායක වෙයි. | |
| | **7.5.5 ශුද්ධ වූ පැයට භක්තියෙන් සහභාගී වෙයි.** | **23 පාඩම ශුද්ධ වූ පැය**<br>• ශුද්ධ වූ පැයෙහි ඉතිහාසය<br>• කළ යුතු අවස්ථා<br>• කළ හැකි ආකාර<br>• කිරීමේ පරමාර්ථ<br>• සාම්ප්‍රදායික ශුද්ධ වූ පැයයෙහි අනුපිළිවෙල | • ශුද්ධ වූ පැය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• භක්තියෙන් යුතු ව ශුද්ධ වූ පැය කිරීමෙන් ජේසුස් වහන්සේගේ වේදනාවට අපට ද පංගුකාර විය හැකි බව පිළිගනියි.<br>• ශුද්ධ වූ පැය පිළිබඳ පොත් පිංචක් සකස් කරයි.<br>• හැකි සෑමවිට ම ශුද්ධ වූ පැයට සහභාගි වෙයි.<br>• ශුද්ධ වූ පැයට අන් අය සහභාගි කරවා ගනියි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **7.5.6 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට නිසි ගෞරවය දක්වයි.** | **24 පාඩම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීම හා දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර**<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ව බැහැදැකීමේ පරමාර්ථ<br>• එසේ කළ යුතු අවස්ථා<br>• දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරේ පරමාර්ථ<br>• දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර පවත්වන අවස්ථා<br>• දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරට සහභාගී විය යුතු අන්දම<br>• පූර්ව සූදානම (දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර)<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ඇති දෙව්මැදුරක හැසිරිය යුතු ආකාරය | • දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ව බැහැදැකීම හා පෙරහැර පැවැත්වීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• හැකි සෑම අවස්ථාවක ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකිය යුතු බව පිළිගනියි.<br>• දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරයි.<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීම තුළින් ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගනියි.<br>• දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර සංවිධාන කටයුතුවල දී සහයෝගය ලබා දෙයි. | 02 |
| | **7.5.7 යෝග්‍ය ලෙස වන්දනා ගමන්වල නිරත වෙයි.** | **25 පාඩම වන්දනා ගමන්**<br>• වන්දනා ගමන් යාමේ පරමාර්ථ<br>• වන්දනා ගමන් තුළ හැසිරිය යුතු ආකාරය<br>• වන්දනා ස්ථානවල ඇඳුම් පැළඳුම් හා හැසිරිය යුතු අන්දම<br>• ලංකාවේ ප්‍රධාන වන්දනා ස්ථාන හා ඒවා පිළිබඳ තොරතුරු (මඩු, තලවිල, තේවත්ත, මාතර)<br>• විදේශීය ප්‍රධාන වන්දනා ස්ථාන හා ඒවා පිළිබඳ තොරතුරු (ශුද්ධ වූ දේශය, පාදුවා, ගෝව) | • වන්දනා ගමන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සංයමයකින් වන්දනා ගමන තුළ හැසිරිය යුතු බව පිළිගනියි.<br>• වන්දනා ස්ථාන කිහිපයක තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.<br>• දිව්‍ය පූජාවන් හා භක්ති අභ්‍යාසවල නිරත වෙමින් ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගනියි.<br>• වන්දනා ස්ථානවල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**01 වන පාඩම**

**දිවැසිවරු**

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිතා කරයි.

**නිපුණතා මට්ටම** 7.1.1 : දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ඉශ්‍රායෙල් දිවැසිවරු පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව හඬට සවන් දිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දෙවියන් වහන්සේ වෙනුවෙන් හඬ නගයි.
- දේව පණිවිඩයට ප්‍රතිචාර දැක්වීමට අන් අය යොමු කරවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර** 1

- විදේශීය රටකට යවනු ලබන තානාපතිතුමෙකුගේ කාර්යභාර්ය සාකච්ඡා කරන්න.
  - රට වෙනුවෙන් පෙනී සිටීම
  - රට වෙනුවෙන් කථා කිරීම
- දෙවියන් වහන්සේ වෙනුවෙන් ද පෙනී සිටීමට හා කථා කිරීමට පුරාණ ගිවිසුම සමයේ දිවැසිවරුන් එවූ බව
- සිසුන් දන්නා දිවැසිවරුන් කිහිප දෙනෙකුගේ නම් විමසන්න.

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - හෙබ්‍රෙව් බසින් "නබී"
  - ග්‍රීක බසින් "ප්‍රොෆෙටේස්"
  - එම වචනවල අර්ථ: "තවත් කෙනෙක් වෙනුවෙන් කථා කරන තැනැත්තා"
  - ඒ අනුව දිවැසිවරයෙක් යනු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තෙකි

- දිවැසිවරු ප්‍රධාන කොටස් 2කි
    1. දේශකඃ මොවුන් නමින් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ නොමැති වුව ද ඔවුන්ගේ වචන හා ක්‍රියා සාමුවෙල් හා රාජාවලිය ග්‍රන්ථවල ඇත. නාතාන්, එලියා හා එලිෂා මේ සඳහා උදාහරණ වේ
    2. ලේඛකඃ මොවුන් නමින් ග්‍රන්ථ පුරාණ ගිවිසුමේ ඇත. මොවුන් කොටස් 2කි.
        i. ප්‍රධාන දිවැසිවරුඃ 3කි. යෙසායා, ජෙරමියා සහ එසකියෙල්
        ii. සුළු දිවැසිවරුඃ 12කි. හොසියා, ජෝවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබක්කුක්, ශෙපනියා, හග්ගායි, සෙකරියා හා මලාකි
- ඉශ්‍රායෙල් දිවැසිවරු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කළා සේ සෑම කිතුනුවෙකු ම දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කිරීමට කැඳවීමක් ලබා ඇති බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

පෙළපොතේ පළමු පාඩම කියවා, "ඉශ්‍රායෙල් දිවැසිවරු" පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුලේ එකිනෙකාට නිවැරදි මග පෙන්වන්න.

## 02 වන පාඩම

## දේශක දිවැසිවරු

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 7.1.2 : අන් අයට දේව වචනය ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දේශක දිවැසිවරු පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දිව්‍ය සංරක්ෂණය පතා දිනපතා යාච්ඤා කරයි.
- අන් අය ව යහපත් දිවි පෙවෙතකට යොමු කරවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- අසන පණිවිඩයක හා යමක් කියවා තේරුම් ගැනීමක ඇති වෙනස
  - කියවීමට හැකි වුවත් නැතත් / සාක්ෂරතාව ඇතත් නැතත් අසන පණිවිඩයක් තේරුම් ගැනීමට හැකි බව (ඍජු සංනිවේදනය නිසා)
  - යමක් කියවා තේරුම් ගැනීමට සාක්ෂරතාව අනිවාර්යෙන් ම තිබිය යුතු බව (වක්‍ර සංනිවේදනය නිසා)
- දිවැසිවරයෙක් යනු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන පුද්ගලයකු බව
- දේශක දිවැසිවරුන්ගෙන් එම කාර්ය මැනවින් ඉටු වී ඇති බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
- නාතාන් දිවැසිවරයා
  - දාවිත් රජතුමාගේ පාපය (2 සාමුවෙල් 11:1-5)
  - නාතාන් දිවැසිවරයාගේ උපමාව (2 සාමුවෙල් 12:1-7)
  - අප ද අයහපතට නැඹුරු වූවන්ට උපක්‍රමශීලී ව වැරදි පෙන්වා දෙමින් යහපත් මාර්ගයට ගත යුතු බව

- එලියා දිවැසිවරයා
    - නියඟයේ දී දිව්‍ය සංරක්ෂණය (1 රාජාවලිය 17:1-15)
    - කාර්මෙල් කන්ද මත පූජාව (1 රාජාවලිය 18:21-38)
    - නියඟය නිමාව (1 රාජාවලිය 18:41-46)
    - එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය පතා යාච්ඤා කළ යුතු බව
- එලිෂා දිවැසිවරයා
    - එලිෂා දිවැසිවරයාගේ කැඳවීම (1 රාජාවලිය 19:19-21)
    - නාමන්ගේ කුෂ්ඨය සුව කිරීම (2 රාජාවලිය 5:1-17)
    - යාච්ඤාවෙන් සුවය අත්දැකිය හැකි බව
    - සැමවිට ම එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

- ඔබ කණ්ඩායමට ලැබී ඇති ශුද්ධ බයිබල් පාඨ ශුද්ධ බයිබලය පෙරළා කියවන්න.
- එම ශුද්ධ ලියවිලි පාඨ තුළින් ඉදිරිපත් කෙරෙන සිද්ධි නිර්මාණාත්මක ව පංතිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
    - 1 කණ්ඩායම: නාතාන් දිවැසිවරයා
        - 2 සාමුවෙල් 11:1-5
        - 2 සාමුවෙල් 12:1-7
    - 2 කණ්ඩායම: එලියා දිවැසිවරයා
        - 1 රාජාවලිය 17:1-15
        - 1 රාජාවලිය 18:21-38
        - 1 රාජාවලිය 18:41-46
    - 3 කණ්ඩායම: එලිෂා දිවැසිවරයා
        - 1 රාජාවලිය 19:19-21
        - 2 රාජාවලිය 5:1-17

**ගෙදර පරිසරයෙන්**

අවස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කරන්න

## 03 වන පාඩම

## ප්‍රධාන දිවැසිවරු

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි

**නිපුණතා මට්ටම** 7.1.3 : දේව කැඳවීමට ප්‍රතිචාර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේවස්ථානයේ ගරුත්වය ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- නායකත්වයේ වගකීම් වගවීමෙන් ඉටු කරයි.
- වගකීම් ඉටු කරමින් අන් අයට සේවය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- බලාපොරොත්තු නොවන අවස්ථාවක පංති නායක තනතුරට / සමිතියක නිලයකට පත් කළ විට ඇතිවන හැඟීම් සාකච්ඡාව කරන්න.
  - භය
  - අවිනිශ්චිත බව
  - වගකීම භාර ගැනීමට මැලිකම
  - වගකීම ප්‍රතික්ෂේප කිරීම
- මෙම තත්ත්වය දිවැසිවර කැඳවීමේ දී ද දැකිය හැකි බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න
  - යෙසයා දිවැසිවරයා
    - නමෙහි අර්ථයඃ දෙවියන් වහන්සේ ගලවන සේක
    - ක්‍රි.පූ. 8වන සියවසේ ජීවත් වූ "ජෙරුසලමේ යෙසායා" නමින් මෙම ග්‍රන්ථය නම් කර ඇත.
    - ජෙරුසලමේ යෙසායාගේ පියාඃ ආමොස්

- ජෙරමියා දිවැසිවරයා
  - නමෙහි අර්ථය: දෙවියන් වහන්සේ උසස් කළ සේක
  - ක්‍රි.පූ. 7-6වන සියවසේ ජීවත් වූ දිවැසිවරයෙකි
  - ඉශ්‍රායෙල් ජනතාවගේ පාප හා මිථ්‍යා ඇදහිලි නිසා ඇතිවන්නට යන විපත් පිළිබඳ ව අනතුරු අඟවයි
- ජෙරමියා දිවැසිවරයාගේ පණිවිඩයට සවන් නොදීම නිසා බබිලෝනියාවේ අධිරාජ්‍යයා පැමිණ, ජෙරුසලම හා දේව මන්දිරය විනාශ කර, ඉශ්‍රායෙල්වරුන් වහලුන් ලෙස බබිලෝනියාවට ගෙන ගියේ ය.
- එසකියෙල් දිවැසිවරයා
  - නමෙහි අර්ථය: දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක
  - ක්‍රි.පූ. 6වන සියවසේ ජීවත් වූ දිවැසිවරයෙකි
  - බබිලොනියාවේ විප්‍රවාසගත ව සිටිමින් දේව පණිවිඩය ප්‍රකාශ කළේ ය
- යෙසායා දිවැසිවරගේ කැඳවීම
  - යෙසයා 6/1-4: දෙවියන් වහන්සේ සිංහාසනයක් මත වැඩ සිටීම, ඔවුන් වහන්සේගේ සළුවෙන් දේව මාලිගාව පිරීතිබීම, දේව දූතයන් දෙවියන් වහන්සේ සිසාරා සිටීම, දේව දූතයන්ට තිබූ පියාපත් 6න් දෙකකින් මුහුණ ද, දෙකකින් ඇඟ ද වසාගෙන ඉතිරි දෙකෙන් පියාඹමින් දෙවියන් වහන්සේගේ සුවිශුද්ධභාවය කියා පාමින් මොර ගැසීම, එම හඬට දේව මාලිගාවේ අත්තිවාරම දෙදරීම
  - යෙසයා 6/5: අපවිත්‍ර තොල් ඇති ව අපවිත්‍ර තොල් ඇති සෙනඟක් අතර වසන කාලකණ්ණියකු බව කීම
  - යෙසයා 6/6-7: දේව දූතයෙක් අඬුවකින් දේව මාලිගාවේ පූජාසනයෙන් ගිනි අඟුරක් රැගෙන දිවැසිවරයා ළඟට පියාසර කර එය තොල්වල තවරා පව් කමා කළ බව
  - යෙසයා 6/8: "මම කවරෙකු යවම් ද? අප වෙනුවෙන් යන්නේ කවරෙක් ද?" යන දෙවියන් වහන්සේගේ හඬ ඇසීම "මෙන්න, මම මෙහි ය, මා යැව්ව මැනවැ"යි කීම

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- පෙළපොතේ තෙවන පාඩම කියවන්න
- ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න

1 කණ්ඩායමː යෙසයා දිවැසිවරයා පිළිබඳ හැඳින්වීමක් හා යෙසයා දිවැසිවරයාගේ කැඳවීම
2 කණ්ඩායමː ජෙරමියා දිවැසිවරයා පිළිබඳ හැඳින්වීමක් හා යෙසයා දිවැසිවරයාගේ කැඳවීම
3 කණ්ඩායමː එසකියෙල් දිවැසිවරයා පිළිබඳ හැඳින්වීමක් හා යෙසයා දිවැසිවරයාගේ කැඳවීම

**ගෙදර පරිසරයෙන්**

වගකීම් භාර ගැනීමට දරුවන් හුරු කරවන්න

## 04 වන පාඩම

## සුළු දිවැසිවරු

**නිපුණතාව** **1.0** : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි

**නිපුණතා මට්ටම** **7.1.4** : කාලයේ සලකුණු අනුව දිවැසිවර කාර්යයේ නියැලෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ආමොස්, හොසියා හා ජෝනා යන සුළු දිවැසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සාධාරණත්වය වෙනුවෙන් හඬ නැගිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරයි.
- අන් අය ව මනස්තාපයට යොමු කරවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- විවිධ සමාජ අසාධාරණකම් ගැන කියැවෙන පුවත් සිරස්තල ඇතුළත් පෝස්ටරයක් පංතියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ සිසු අදහස් විමසන්න.
- කිතුනුවන් ලෙස එම අසාධාරණකම් ඉදිරියේ මුනිවත රැකීම කෙතරම් දුරට යෝග්‍යය දැයි විමසන්න.
- සමාජ අසාධාරණකම් ඉදිරියේ හඬ නැගූ පුරාණ ගිවිසුමේ සිටි පුද්ගල කණ්ඩායම පිළිබඳ විමසන්න. (ඉශ්‍රායෙල් දිවැසිවරු)

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
    - ආමොස් දිවැසිවරයා
        - ක්‍රි.පූ. 8වන සියවසේ ජීවත් වූ දිවැසිවරයෙකි.

- ගම: තෙකෝවා
- එඬේරෙක්, අත්තික්කා වගා කළ ගොවියෙක්
- ඔහුගේ පණිවිඩයේ වැදගත් ම තේමාව: සමාජ සාධාරණත්වය
- "සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා" ලෙස හැඳින්වේ
- සැම විට සාධාරණ දිවි පෙවෙතක් ගත කරමින්, සමාජ අසාධාරණකම් ඉදිරියේ හඬ නැගීම කිතුනු අපගේ යුතුකමක්

- හොසියා දිවැසිවරයා
  - ක්‍රි.පූ. 8වන සියවසේ ජීවත් වූ දිවැසිවරයෙකි
  - ඔහුගේ විවාහ දිවිය දිවැසිවර පණිවිඩයකි
  - ඔහු විවාහ කරගත් ගොමෙර් වෙනත් ස්වාමි පුරුෂයන් පසුපස ගියා ය
  - හොසියා ඇය ව මනස්ථාපනයට කැඳවමින් සමාව දුන්නේ ය
  - මෙයින් ගෙනෙන පණිවිඩය වන්නේ, ඉශ්‍රායෙල් ජනතාව ද දෙවියන් වහන්සේට පිටු පා වෙනත් දෙවි දේවතාවන් පසුපස යන බව ය
  - අප ද එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනාමාන කරමින් ඔවුන් වහන්සේට පමණක් සේවය කළ යුතු ය
- ජෝනා දිවැසිවරයා
  - ක්‍රි.පූ. 8වන සියවසේ ජීවත් වූ දිවැසිවරයෙකි
  - ජෝනා දිවැසිවරයා ලද කැඳවීම වූයේ, තම ජාතියේ විරුද්ධවාදීන් ජීවත් වූ නිනීවයට ගොස් මනස්තාපනය සඳහා ජනතාව කැඳවීම ය
  - එහෙත් ඔහු තම කැඳවීමට පිටුපා තර්ෂිස්ට පිටත් ව යයි
  - ඔහු ගිය නැව කුණාටුවකට හසු වෙයි
  - කුණාටුවට හේතු වූ පුද්ගලයා හඳුනා ගැනීම සඳහා දදු දමයි
  - දාදුව ජෝනා දිවැසිවරයාට වැටෙයි
  - ජෝනා දිවැසිවරයා තම වරද නැවේ සිටි අයට පවසයි
  - කුණාටුව තව තවත් උග්‍රවන විට නැවේ සිටි අයගේ අකමැත්ත හා ජෝනා දිවැසිවරයාගේ බලවත් ඉල්ලීම මත ජෝනා දිවැසිවරයා ව මුහුදට දමයි
  - ජෝනා දිවැසිවරයා ව මාළුවෙකු ගිල නිනීවයට ගොස් දින තුනකින් වමාරයි
  - ජෝනා දිවැසිවරයා නිනීවයේ ජනතාව මනස්තාපයට කැඳවයි
  - ජනතාව මනස්තාප වී, නිරාහාරශීලී ව යාච්ඤා කරයි
  - දෙවියන් වහන්සේගේ සමාව ඔවුනට හිමි වේ
  - අප ද අපගේ පව්වලට දුක්මනස්ථාප වී, නැවත පව් නොකිරීමට ඉටාගෙන හොඳ පාපෝච්චාරණයක් කළ යුතු ය.
  - අයහපත තුළ ජීවත් වන අයට නිවැරදි මග කියා දී මනස්තාපයට කැඳවන්න

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- 1 කණ්ඩායමඃ ආමොස් දිවැසිවරයා
  ශුද්ධ බයිබලය පෙරළා ආමොස් දිවැසිවරයා පිළිබඳ ඇති හැඳින්වීම කියවා එම දිවැසිවරයා පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදනම් වන්න.

- 2 කණ්ඩායමඃ හොසියා දිවැසිවරයා
  ශුද්ධ බයිබලය පෙරළා හොසියා දිවැසිවරයා පිළිබඳ ඇති හැඳින්වීම කියවා එම දිවැසිවරයා පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදනම් වන්න.

- 3 කණ්ඩායමඃ ජෝනා දිවැසිවරයා
  ශුද්ධ බයිබලය පෙරළා ජෝනා දිවැසිවරයා පිළිබඳ ඇති හැඳින්වීම කියවා එම දිවැසිවරයා පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදනම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දඬුවමට වඩා දරුවන් මනස්තාපයට කැඳවන්න.

## 05 වන පාඩම

## ආබ්‍රහම් තුමාගේ කැඳවීම

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 7.2.1** : දේව කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේ දී ජීවිත වෙනසක් ඇති කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ආබ්‍රහම් තුමාගේ කැඳවීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- අභියෝගවලට නිර්භය ව මුහුණ දිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- තම කැඳවීම්වලට කීකරු වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය ලබා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- විවිධ කැඳවීම් ලබා ඇති පුද්ගලයන් දැක්වෙන පෝස්ටරය පන්තියට ඉදිරිපත් කර ඒ පිළිබඳ සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- දෙවියන් වහන්සේ විවිධ පුද්ගලයන් විවිධ සේවා සඳහා කැඳවන බව
- ගැලවුම්කරුවාණන් එවීමට ආරම්භකයා ලෙස ආබ්‍රහම් තුමා ව කැඳවූ බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- ආබ්‍රහම් තුමාගේ කැඳවීම (උත්පත්ති 12/1-9)
- ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග 2
  1. පරිත්‍යාග 2. අභියෝග
- ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදුවූ දේවල් 3
  1. මවුබිම
  2. නෑදෑයන්
  3. පියාගේ ගෘහය

- ආබ්‍රහම් තුමාට මුහුණදීමට සිදුවූ අභියෝග 3
  1. මහත් (විශාල) ජාතියක් ඇති කිරීම
  2. සංචාරක ජීවිතයක් ගත කිරීමට සිදුවීම
  3. නොදන්නා දේශයකට යාමට සිදුවීම
- දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට දුන් පොරොන්දු 2
  1. ආබ්‍රහම් තුමා මගින් විශාල ජාතියක් ඇති කිරීම
  2. ආබ්‍රහම් තුමාගේ පෙළපතට දේශයක් දීම
- ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් ගත හැකි ආදර්ශ
  - දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තබා ක්‍රියා කළ යුතු බව
  - අපගේ ජීවිත ගමනේ දී විවිධ දේ පරිත්‍යාග කිරීමට සිදුවන බව
  - අපට ලැබෙන විවිධ අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය යුතු බව
  - දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන කැඳවීම්වලට කීකරු වෙමින් ජීවිත වෙනසක් ඇති කර ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ්/ ඩිමයි, ජ්ලැටිග්නම්
- විවිධ කැඳවීම් ලබා ඇති පුද්ගලයන් දක්වෙන පෝස්ටරය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

I. කණ්ඩායම

උත්පත්ති 12/1-9, කියවා ආබ්‍රහම් තුමා පරිත්‍යාග කළ දේවල් තුන හා මුහුණුදීමට සිදුවූ අභියෝග තුන පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

ii. කණ්ඩායම

උත්පත්ති 12/1-9, කියවා ආබ්‍රහම් තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු දෙක පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්**

අභියෝගවලට මුහුණදීමට දරුවන් හුරු කරවන්න.

## 06 වන පාඩම
## ආබ්‍රහම් තුමා සමග කළ ගිවිසුම

**නිපුණතාව** **2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** **7.2.2** : සැම විට ගිවිසුම් ජීවිතයට විශ්වාසවන්ත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ආබ්‍රහම් තුමා සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ප්‍රසාද ස්නාපනයේ දී අප ගිවිසුම් ජීවිතයට බැඳෙන බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සැම විට ගිවිසුම් ජීවිතයට විශ්වාසවන්ත වෙයි.
- අන් අයට දුන් පොරොන්දු ඉටු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර** 1

- ඇමුණුම 2 ක්‍රියාත්මක කර පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.
- දෙමාපියන් දෙව්මිණී සමග පොරොන්දුවක් ඇති කර ගත් බව
- දෙව්මිණී දෙමාපියන් සමග ඇති කර ගත් පොරොන්දුව ඉටු කළ බව
- නූතන සමාජය තුළ විවිධ ගිවිසුම් ඇති බව
  විවාහ ගිවිසුම්, සාම ගිවිසුම්, වෙළෙඳ ගිවිසුම්
- ගිවිසුමක් ඇති කළ පසු එය ඉටු කළ යුතු බව
- මිනිසුන් අතර සිදුවන ගිවිසුම්වලට වඩා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර ඇති වන ගිවිසුම්වල විශේෂත්වයක් ඇති බව
- ගිවිසුමේ මුල් පියවර තබන්නේ දෙවියන් වහන්සේ බව
- ගිවිසුම කුමක් දැයි ඉදිරිපත් කරන්නේ දෙවියන් වහන්සේ බව
- දෙවියන් වහන්සේ ස්වකීය ගිවිසුමේ පොරොන්දු ඉටු කරන බව

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ආබ්‍රහම් සමග ගිවිසුම (උත්පත්ති 15/1-21, 17/1-14)
  - ගිවිසුමේ වැදගත් කරුණු 2

1. අසංඛ්‍ය වූ දරු පරපුරක් (උත්පත්ති 15/5, 17/6)
2. සදා කාලයට ම හිමි වන දේශයක් (උත්පත්ති 15/21, 17/8)

- ගිවිසුම කළ ආකාරය
  ගිවිසුමේ ලකුණ (චර්මච්ඡේදනය) (උත්පත්ති 17/10-14)
- ආබ්‍රහම් තුමාගේ නම වෙනස් කිරීම හා නම්වල අර්ථ (උත්පත්ති 17/5)
- නම වෙනස් කිරීම තුළින් ඔහුගේ නව ජීවිත පැවැත්ම හා තත්ත්වය පෙන්නුම් කරන බව
- අපට ප්‍රසාද ස්නාපනයේ දී ක්‍රිස්තියානි නමක් ලැබෙන බව
- ප්‍රසාද ස්නාපනය මගින් අප ගිවිසුම් ජීවිතයට ඇතුළු වන බව
- ප්‍රසාද ස්නාපන පොරොන්දු අනුව අප ජීවත් විය යුතු බව

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1/2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

I. කණ්ඩායම
   උත්පත්ති 15/1-21 කියවා ආබ්‍රහම් තුමා සමග කළ ගිවිසුම නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.
ii. කණ්ඩායම
   උත්පත්ති 17/1-14 කියවා ගිවිසුම කළ ආකාරය නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න.
iii. කණ්ඩායම
   උත්පත්ති 17/1-5 කියවා ආබ්‍රහම් තුමාගේ නම වෙනස් කිරීම හා නම්වල අර්ථ පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 2**

(දෙව්මිණිගේ කථාව සිසුන්ට කතාන්දරයක් ආකාරයෙන් කියන්න)

දෙව්මිණි ඉතා හිතුවක්කාර දැරියකි. ඇයට දෙමව්පියන්ගේ ආදරය නොමඳව ලැබුණි. දෙමව්පියන් ඇගේ හිතුවක්කාර ජීවිතය පිළිබඳ ව දුකෙන් පසුවූවා ය. ඇය තම අධ්‍යාපන කටයුතු පිළිබඳ ව එතරම් සැලකිල්ලක් නොදැක්වූවා ය. ඒ පිළිබඳ ව දෙමව්පියන් ඇය සමග කතා කිරීමට තීරණය කළෝ ය. ඇයගේ වැරදි ක්‍රියා කලාපය පිළිබඳ ව ඇයට වටහා දී එයින් මිදී යහපත් ජීවිතයක් ගත කිරීමට දෙමව්පියෝ ආදරයෙන් ඔවදන් ලබා දුන්හ. එහි දී ඔවුන් ඇය ව නිවසේ සුරුවම අසලට ගෙන ගොස් තම ජීවිතය වෙනස් කර ගන්නා බවට පොරොන්දු කර ගන්නා ලදි.

කාලයක් ගත වන විට තම දියණියගේ ජීවිතයේ යම් වෙනසක් දෙමව්පියන්ට දැනුනි. ඇය ආගමට දහමට ලැදි යහපත් ගුණාංගවලින් හෙබි දැරියක් වූවා ය. තම අධ්‍යාපන කටයුතු පිළිබඳ ව උනන්දු වූවා ය. දෙවියන් වහන්සේ හා දෙමව්පියන් ඉදිරියේ තමා තැබූ පොරොන්දුව ඒ අයුරින් ම ඉටු කිරීමට  දෙව්මිණි සැම විට උත්සාහ ගත්තා ය.  ඇය සැම දෙනාගේ ප්‍රසාදය දිනා ගත් ආදර්ශවත් දැරියක් වූවා ය.

**ගෙදර පරිසරයෙන්**

දරුවන්ට ක්‍රිස්තියානි නම් තැබීමට උනන්දු වන්න.

## 07 වන පාඩම

## ඊසාක් තුමා

**නිපුණතාව 2.0 :** දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම 7.2.3 :** දෙමාපියන්ට කීකරු යහපත් දරුවෙක් වෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ඊසාක් පිළිබඳ කරුණු ගොනු කරයි.
- අන් අය සමග සාමයෙන් විසිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දෙමාපියන්ට කීකරු යහපත් දරුවෙක් වෙයි.
- සහයෝගයෙන් ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඊසාක් තුමාව පූජා කරනු ලබන පින්තූරයක් සිසුන්ට ඉදිරිපත් කර පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- ඊසාක් තුමාගේ දෙමාපියන්
- ආබ්‍රහම් තුමා හා සාරාට මහලු වයසේ දී ඊසාක් උපත ලැබූ බව
- ඊසාක් තුමා පූජා කිරීමට දෙවියන් වහන්සේ පැවසූ බව
- දෙවියන් වහන්සේ බැටළුවෙක් දෙමින් ඊසාක් තුමාව මුදාගත් බව

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ඊසාක් තුමාගේ උපත (උත්පත්ති 21/1-8)
  - ඊසාක් තුමා පූජා කරනු ලැබීම (උත්පත්ති 22/1-19)
  - ඊසාක් තුමා මගින් ගිවිසුම අලුත් කිරීම (උත්පත්ති 26/19-25)
  - ඊසාක් තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ
    - දෙමාපියන්ට කීකරු යහපත් දරුවකු වීම
    - දෙමාපියන්ට ඇහුම් කන්දීම
    - අන්‍යයන් සමග ගැටුම් ඇති කර නොගැනීම
    - විශ්වාසයෙන් යාච්ඤා කිරීම

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය,
- බ්‍රිසල්බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1
- ඊසාක් තුමා පූජා කරනු ලබන පින්තූරයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

i. කණ්ඩායම

උත්පත්ති 21/1-8 කියවා ඊසාක් තුමාගේ උපත නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

ii. කණ්ඩායම

උත්පත්ති 22/1-19 කියවා ඊසාක් තුමා පූජා කරනු ලැබීම රඟ දක්වන්න.

iii. කණ්ඩායම

උත්පත්ති 26/19-25 ඊසාක් තුමා මගින් ගිවිසුම අලුත් කිරීම නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්**

ජිවිතයට පැමිණෙන දුක් කරදර ඉවසීමෙන් දරා ගැනීමට හුරු කරවන්න.

## 08 වන පාඩම

## ජාකොබ් තුමා

**නිපුණතාව** **2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි..

**නිපුණතා මට්ටම** **7.2.4** : සහෝදරයා සමග සමගියෙන් ජීවත් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ජාකොබ් තුමා පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- සහෝදරයන් සමග සමගියෙන් ජීවත් විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව හඬට ප්‍රතිචාර දක්වයි.
- අන් අය සමග සමගියෙන් ජීවත් වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- ජාකොබ් තම සහෝදරයාගේ වැඩිමල්කම ආහාර දී කපටිකමින් ලබා ගත් බව
- කපටිකම හොඳ චර්යාවක් නොවන බව
- අන් අයට උදව් කළ යුත්තේ වාසි බලාපොරොත්තුවෙන් නොවන බව
- අන් අයට උදව් කිරීමේ දී කොන්දේසි නොපැනවිය යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- ජාකොබ් තුමාගේ උපත (උත්පත්ති 25/19-26)
- බෙතෙල්හි දර්ශනය, ගිවිසුම අලුත් කිරීම (උත්පත්ති 28/10-22)
  - ජාකොබ් හාරාන් දේශය බලා යෑම
  - ගලක් මත නිදා සිටින විට ජාකොබ් දුටු අරුම පුදුම සිහිනය
  - පොළොවෙහි තබන ලද ඉණිමගකි. එහි මුදුන අහස දක්වා විය.

- දේව දූතයෝ එහි නගිමින් ද, බසිමින් ද සිටියෝ ය.
- ස්වාමීන් වහන්සේ ඊට ඉහළින් සිට ජාකොබ් අමතා, ආබ්‍රහම් තුමා හා ඊසාක් තුමා සමග ඇති කරගත් ගිවිසුම ජාකොබ් මගින් ඉදිරියට ගෙන යන බව ප්‍රකාශ කිරීම

- පෙනුයෙල්හි දර්ශනය (උත්පත්ති 32/24-30)
  - ජාකොබ් තුමා සමග එක්තරා මිනිසෙක් පහන් වනතුරු පොර බැදීම
  - එම තැනැත්තාට යන්නට දුන්නේ ආශිර්වාදය ලබා ගැනීමෙන් පසු ව ය.
  - මෙතෙක් ජාකොබ් නමින් පෙනී සිටි පුද්ගලයා එතැන් සිට ''ඉශ්‍රායෙල්'' නම් විය.
- ඒසව් සමග සමගිවීම (උත්පත්ති 33/1-3)
  - ලබා ගත හැකි ආදර්ශ
    - තමාගේ වැරදි පිළිගෙන සමාව ලබා ගත යුතු ය.
    - සමාව දීම උතුම් ගුණයකි.
    - තමාට වැරදි කළ අයට සමාව දිය යුතු ය.
    - වචනයෙන් සමාව දීම පමණක් නොව ක්‍රියාවෙන් එය ඔප්පු කළ යුතු ය.
    - සහෝදරයා සමග සමගියෙන් ජීවත් විය යුතු ය.

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

i. කණ්ඩායම

උත්පත්ති 25/19-26 කියවා ජාකොබ් තුමාගේ උපත පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

ii. කණ්ඩායම

උත්පත්ති 28/10-22 කියවා බෙතෙල්හි දර්ශනය පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

iii. කණ්ඩායම

උත්පත්ති 32/24-30 කියවා පෙනුයෙල්හි දර්ශනය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

iv. කණ්ඩායම

උත්පත්ති 33/1-3 කියවා එයින් ඔබට ලැබෙන පණිවිඩ ලියා දක්වන්න.

**ඇමුණුම 2**

- පෙර පුහුණුවකින් යුතු ව ඇමුණුම 2 ක්‍රියාත්මක කරන්න.
- ජාකොබ් ඒසව්ගේ වැඩිමල්කම කපටිකමින් ලබා ගැනීම

ඒසව් : මල්ලී මට නම් හරි ම බඩගිනියි. ඔයා හදපු කෑමෙන් මට ටිකක් දෙන්න.

ජාකොබ් : ආ එහෙම නිකම් දෙන්නේ නැහැ. මම මහන්සි වෙලයි මෙය හැදුවේ. මට ඒ වෙනුවට දෙන්නේ මොනව ද?

ඒසව් : මට ඕවා හිතන්න වෙලාවක් නැහැ. මට යකෙන් කන්න බඩගිනියි. මොනවද මගෙන් ඔයාට ඕනේ.

ජාකොබ් : මට ඔයාගේ කුලුදුල්කමේ උරුමය දෙන්න.

ඒසව් : මට බඩගිනියි. කුලුදුල්කමෙන් මට වැඩක් නැහැ ඒක ඔයා ගන්න.

ජාකොබ් : ආ හා! හරි එහෙනම් මම ඔයාට කෑම ඕන තරම් දෙන්නම්. එහෙනම් අදින් පස්සෙ මම යි වැඩිමලා. ඔයා මම කියන දේ අහන්න ඕනෑ. තාත්තාගේ දේපළවලින් වැඩි ප්‍රමාණයක් මට යි අයිති.

ඒසව් : හ්ම්

**ගෙදර පරිසරයෙන්**

සෑම දෙනා සමග සමගියෙන් කටයුතු කිරීමට හුරු කරවන්න.

## 9 වන පාඩම

## අපෝස්තුලුවරුන්ගේ කැඳවීම

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම 7.2.5** : එදිනෙදා ජීවිතයේ ලැබෙන කැඳවීම්වලට නිසි ප්‍රතිචාර දක්වයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- අපෝස්තුලුවරුන් කැඳවීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- තම කැඳවීම්වලට නිසි ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව වචනය කියවා මෙනෙහි කරයි.
- දේව වචනයට සවන්දීමේ වැදගත්කම පහදා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ප්‍රථම ශ්‍රාවකයන් හතර දෙනා කැඳවීම් දැක්වෙන පින්තූරයක් පන්තියේ ප්‍රදර්ශනය කර, පහත සඳහන් කරුණු පදනම් කර ගෙන සාකච්ඡාවක් කරන්න.
- ජේසුස් වහන්සේ ගලීල මුහුද අසල දී ප්‍රථම ශ්‍රාවකයන් හතර දෙනා කැඳවූ බව.
- ඔවුන් හතර දෙනාගේ නම් (පේදුරු තුමා, ඇන්ඩෘ තුමා, මහා ජාකොබ් තුමා හා ජොහන් තුමා)
- ජේසුස් වහන්සේ අපෝස්තුලුවරු දොළොස් දෙනෙක් තෝරාගත් බව
- අපෝස්තුලුවරු තෝරා ගනු ලැබුවේ ධර්මදූත කාර්ය ඉදිරියට ගෙන යාමට බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ප්‍රථම ශ්‍රාවකයන් හතර දෙනා කැඳවීම (මතෙව් 4/18-22)
  - මතෙව් තුමාගේ කැඳවීම (මතෙව් 9/9-13)
  - අපෝස්තුලුවරු දොළොස්දෙනාගේ නම් (මතෙව් 10/2-4) පේදුරු තුමා, ඇන්ඩෘ තුමා, සෙබදිගේ පුත් ජාකොබ් තුමා (මහා ජාකොබ් තුමා) ජොහන් තුමා, පිලිප් තුමා, බර්තොලමේව් තුමා, තෝමස් තුමා, මතෙව් තුමා, අල්පේවුස්ගේ පුත් ජාකොබ් තුමා (කුඩා ජාකොබ් තුමා) ජූඩ් තද්දෙවුස් තුමා, අන්තවාදී සීමොන් තුමා, ජුදාස් ඉස්කාරියොත්

- ජුදාස් වෙනුවට මතියස් තුමා පත් කර ගැනීම (ක්‍රියා 1/12-26)
- ධර්මදූත වගකීම් පැවරීම (මතෙව් 28/19-20)
- ප්‍රසාද ස්නාපනය තුළින් අප ව ද ක්‍රිස්තු ශ්‍රාවකයකු ලෙස කැඳවා ඇති බව
- ක්‍රිස්තු ශ්‍රාවකයකු ලෙස අප ජීවත් විය යුතු බව
- එදිනෙදා ජීවිතයේ ලැබෙන කැඳවීම්වලට අප නිසි ප්‍රතිචාර දැක්විය යුතු බව
- ධර්මදූත කාර්ය ඉදිරියට ගෙනයෑමට අප දායක විය යුතු බව
- අන් අයට දේව වචනය කියා දීම
- දේව වචනයට සවන්දීමේ වැදගත්කම අන් අයට කියා දීම
- දේව වචනය දිනපතා කියවීම
- සමාජය තුළ වගකීම් නිසි ලෙස ඉටු කිරීම

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම
- බ්‍රිසිල් බෝඩ්/ ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1
- ප්‍රථම ශ්‍රාවකයන් හතර දෙනා කැඳවීම දැක්වෙන පින්තූරයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

ඇමුණුම 1

i. කණ්ඩායම

මතෙව් 4/18-22 කියවා, ප්‍රථම ශ්‍රාවකයන් හතර දෙනා කැඳවීම, රඟ දක්වන්න.

ii. කණ්ඩායම

මතෙව් 9/9-13 කියවා, මතෙව් තුමාගේ කැඳවීම නාට්‍යයකින් ඉදිරිපත් කරන්න.

iii. කණ්ඩායම

මතෙව් 10/2-4 කියවා, අපෝස්තුලුවරු දොළොස්දෙනාගේ නම් නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න.

iv. කණ්ඩායම

ක්‍රියා 1/12-26 කියවා, ජුදස් වෙනුවට මතියස් තුමා තෝරා ගැනීමේ සිද්ධිය වාර්තාවකින් ඉදිරිපත් කරන්න.

v. කණ්ඩායම

මතෙව් 28/19-20 කියවා, අන් අය දෙවිඳුන් වෙත යොමු කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 5ක් ලියා දක්වන්න.

**ගෙදර පරිසරයෙන්**

දේව වචනය අන් අයට බෙදාදීමට කටයුතු කරමු.

## 10 වන පාඩම

## ප්‍රසාද ස්නාපනය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 7.3.1 : ප්‍රසාද ස්නාපන පිළිවෙතට අවබෝධයෙන් යුතු ව සහභාගි වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ප්‍රසාද ස්නාපනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ප්‍රසාද ස්නාපනය මගින් නව ජීවිතයක් ලැබෙන බව පිළිගනියි.
- ළදරුවන්ට ප්‍රසාද ස්නාපනය දානය කරන පිළිවෙත රඟ දක්වයි.
- ප්‍රසාද ස්නාපනය දානය කරන පිළිවෙතට අර්ථවත්ව සහභාගි වෙයි.
- ප්‍රසාද ස්නාපන පිළිවෙත් අර්ථවත් ව කිරීමට සහාය වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ළදරුවන්ට ප්‍රසාද ස්නාපනය දානය කරන පින්තූර කිහිපයක් ප්‍රදර්ශනය කර පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.
- ප්‍රසාද ස්නාපනය දානය කරන විට වතුර, ඉටිපන්දම, සුදු වස්ත්‍රය, ශුද්ධ වූ තෙලය යනාදිය භාවිත කරන බව
- පූජාප්‍රසාදිතුමා ළදරුවන්ගේ හිසට වතුර වත් කරමින් ප්‍රසාද ස්නාපනය දානය කරන බව
- ළදරුවන්ගේ විශ්වාස ජීවිතයේ වගකීම ඥාන මව්පියන්ට භාරවන බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ප්‍රසාද ස්නාපනය දානය කරන අනුපිළිවෙල
  - ත්‍රිත්ව ස්තෝත්‍රය
  - දෙමාපිය හා ආත්මික මව්පියන්ගේ වගකීම් පැවරීම
  - ළදරුවාගේ නළලේ කුරුස ලකුණ සලකුණු කිරීම
  - දේව වාක්‍ය පිළිවෙත

- පූර්ව තෛලය (OC) ආලේප කිරීම
- ප්‍රසාද ස්නාපන ජලය ආශිර්වාද කිරීම
- විශ්වාසය ප්‍රකාශ කිරීම
- ජලයෙන් ප්‍රසාද ස්නාපනය කිරීම
- ක්‍රිස්මා තෛලය (SC) ආලේප කිරීම
- සුදු වස්ත්‍රය පැළඳවීම
- දැල්වූ ඉටිපහනක් අතට දීම
- අවසාන ආශිර්වාදය
- ප්‍රසාද ස්නාපනය පිළිබඳ ශාසන නීති (මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ළදරුවන්ට ප්‍රසාද ස්නාපනය දානය කරන පින්තූර
- ප්‍රසාද ස්නාපනය දානය කිරීමට ගන්නා ද්‍රව්‍ය
- සරල පිළිවෙත් සංග්‍රහය
- ඇමුණුම 1 හා 2
- ඩීමයි, මාකර් පෑන්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

කණ්ඩායම 1: සරල පිළිවෙත් සංග්‍රහය අනුව ප්‍රසාද ස්නාපනය දානය කරන අයුරු රඟ දැක්වීමට සූදානම් වන්න.

කණ්ඩායම 2 : පෙළපොතේ 10වන පාඩම කියවා ප්‍රසාද ස්නාපනය දානය කරන අනුපිළිවෙල ලියා දක්වන්න.

කණ්ඩායම 3 : ඇමුණුම 2 කියවා ප්‍රසාද ස්නාපනය පිළිබඳ ශාසන නීති නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 2**

862 - හදිසි අවශ්‍යතාවයක දී හැර මීසම් සේවක පියතුමාට තම මීසමට අයත් අයකුට පවා තම මීසමෙන් බැහැර ස්ථානයක දී නිසි අවසරයකින් තොර ව ප්‍රසාද ස්නාපනය දානය කළ නොහැකි ය.

857/1 - ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ ස්ථානය වන්නේ දෙව්මැදුර ය.

857/2 - සාධාරණ හේතුවක් නොමැති නම් ප්‍රසාද ස්නාපනය දානය කළ යුත්තේ අදාළ පුද්ගලයා අයත් (මීසම්) දේවස්ථානයේ ය.

865/1 - වැඩිහිටි ප්‍රසාද ස්නාපනය ලබා ගැනීමට සිටින තැනැත්තා ප්‍රසාද ස්නාපනය ලබා ගැනීමට ඇති කැමැත්ත ප්‍රකාශ කළ යුතු ය. විශ්වාසයේ සත්‍යතා හා කිතුනු වගකීම් පිළිබඳ දැනුවත් විය යුතු ය. ධර්මෝපදේශය ලබන සමයේ ක්‍රිස්තියානි ධර්මය අනුව ජීවත් වන බව ප්‍රදර්ශනය කළ යුතු ය. තම පව්වලට මනස්තාප විය යුතු ය.

865/2 - මරණාසන්න පුද්ගලයකුට ප්‍රසාද ස්නාපනය දානය කිරීමට නම් විශ්වාසයේ ප්‍රධාන සත්‍යතා පිළිබඳ දැනුවත් විය යුතු ය. ආශාව යම් ආකාරයකින් ප්‍රදර්ශනය කළ යුතු ය. කිතු දහමේ අපේක්ෂාවන් අනුව ජීවත් වන බවට පොරොන්දු විය යුතු ය.

867/1 - ළදරුවන් පළමු සති කිහිපය ඇතුළත ප්‍රසාද ස්නාපනය කිරීමට දෙමාපියන් කටයුතු කළ යුතු ය. ළදරුවකු උපත ලද විගස හෝ ඊට පෙර මීසම් සේවක පියතුමා ව ඒ පිළිබඳව දැනුවත් කළ යුතු අතර ප්‍රසාද ස්නාපනය දානය කිරීම සඳහා නිසි ලෙස සූදානම් විය යුතු ය.

867/2 - මරණාසන්න ළදරුවන්ට හැකි විගස ප්‍රසාද ස්නාපනය දානය කළ යුතු ය.

868/1 - ළදරුවකු ප්‍රසාද ස්නාපනය කිරිමට

1. අවම වශයෙන් එක් දෙමාපියෙක් හෝ එම ළදරුවාගේ නීත්‍යානුකූල භාරකරුවෙක් තම කැමැත්ත ලබා දිය යුතු ය.
2. දරුවා කතෝලික විශ්වාසය තුළ ඇති දැඩි කරන බවට මීසම් භාර පියතුමාට විශ්වාසයක් තිබිය යුතු ය.

**ගෙදර පරිසරයෙන්**

ඔබේ දෙමාපියන් හා ඥාන මව්පියන් වෙනුවෙන් දිනපතා යාච්ඤා කරන්න.

## 11 වන පාඩම

## පූජකවරය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 7.3.2 : ජනතාව ශුද්ධවත් කරන පියතුමන්ලා වෙනුවෙන් යාච්ඤා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පූජකවරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- පූජක සේවාව අගය කරයි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පූජාප්‍රසාදිවරුන් වෙනුවෙන් යාච්ඤා කරයි.
- පූජාප්‍රසාදිවරුන්ගේ සේවයට සහාය වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- පූජකවරය දානය කිරීමට අදාළ පින්තූර ප්‍රදර්ශනය කර එම පින්තූර පිළිබඳ ව සාකච්ඡාව මෙහෙයවන්න.
- පූජකවරය දානය කරන්නේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ බව
- රදගුරුතුමා පූජකවරුන්ගේ හිස මත අත් තබමින්, යාච්ඤා කර පූජකවරය දානය කරන බව
- පූජකවරය දෙවි පියාණන් වහන්සේගෙන් ලැබෙන උතුම් කැඳවීමක් බව
- පියතුමා දෙවියන් වහන්සේ හා මිනිසුන් අතර මධ්‍යස්ථකයෙක් බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - පදවියේ දේව ජනතාවගේ විශ්වාසය ආරක්ෂා කිරීම රදගුරුතුමාගේ වගකීම බව
  - රදගුරු පදවිය පාලනය කිරීම, ජනතාවට ඉගැන්වීම හා ජනතව ශුද්ධවන්ත කිරීම රදගුරුතුමාගේ කාර්යයන් බව
  - ජනවන්දනා පැවැත්වීම, සුවිශේෂය දේශනා කිරීම, සැබෑ එඩේරෙකු වීම පූජකවරුන්ගේ වගකීම් බව

- රදගුරුතුමාට හා පූජකවරුන්ට සහාය වීම, දේව වචනය ප්‍රකාශ කිරීම හා පිළිවෙත් අනුව ප්‍රසාද ස්නාපනය දානය කිරීම තේවාචාරවරුන්ගේ සේවාවන් බව
- පූජාප්‍රසාදිවරු පදවි පූජක හා පැවිදි පූජක යනුවෙන් කොටස් දෙකක් සිටින බව
- පදවි පූජකවරුන් රාජගුරු ප්‍රසාදින් වහන්සේලා යටතේ තම රදගුරු පදවිය තුළ සේවය කරන බව
- පැවිදි පූජකවරුන් පැවිදි නිකායේ ශ්‍රේෂ්ඨ පියවරුන් යටතේ තම පැවිදි නිකායේ කැරිස්මාව අනුව සේවය කරන බව
- පදවි පූජකවරුන් පොරොන්දු 2ක් ගන්නා බව
  1. කීකරුකම 2. පූජක බඹසර
- පැවිදි පූජකවරුන් ව්‍රතහාර 3 ක් ගන්නා බව
  1. කීකරුකම 2. ව්‍රත ශුද්ධිය 3. දිළිඳුකම
  (පූජක බඹසර හා ව්‍රත ශුද්ධිය යන්නෙහි අර්ථයන් සමාන වේ.)
- අප පූජකවරුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව
- පූජකවරුන්ගේ කටයුතුවලට සහාය වීම, අපගේ යුතුකම බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ්/ ඩිමයි, මාකර්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

පෙළපොතේ 11වන පාඩම කියවා ඔබ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 1 : තේවාචාරී, පූජක හා රාජගුරු ප්‍රසාදීන් වහන්සේලාගේ කාර්යයන් වෙන වෙන ම වගුගත කරන්න.

කණ්ඩායම 2 : පදවි පූජකවරුන් හා පැවිදි පූජකවරුන් අතර වෙනස්කම් ලියා දක්වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා පවුල් ජපමාලය උච්චාරණය කරන විට පූජකවරුන් වෙනුවෙන් යාච්ඤා කරන්න.

## 12 වන පාඩම

## පැවිදි දිවිය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 7.3.3 : පැවිදි ජීවිතය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පැවිදි ජීවිතය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- පැවිදි ජීවිතය දෙවියන් වහන්සේගේ කැඳවීමක් බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පැවිදි ජීවිතය අගය කරයි.
- පැවිදිවරුන්ගේ සේවාවන්ට සහාය වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ශුද්ධ වූ සභාවේ ඇති පැවිදි නිකායන් ගැන විමසා පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- කාර්මෙල් පැවිදි නිකාය, යහපත් එඬේරාගේ පැවිදි නිකාය, ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය, ද ලා සාල් නිකාය මීට නිදසුන් ය.
- මොවුන් සැමදෙනා ම දේව රාජ්‍යය ගොඩනැගීමට සහාය දක්වන බව
- පැවිදි නිකායන් අධ්‍යාපන, සමාජ, මීසම් යනාදී සේවාවන්වල යෙදී සිටින බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - පැවිදි දිවිය කොටස් 2කි.
    1. පැවිදි පූජක 2. පූජක නොවන පැවිදි අය
  - පැවිදි පූජක නිකායන්ට උදාහරණ
    නිර්මල මරිය නිකාය, ජේසු නිකාය, සිල්වෙස්ත්‍රෝ බෙනඩික්ාන නිකාය, දිව්‍ය සත්ප්‍රසාද නිකාය

- පූජක නොවන පැවිදි අය කොටස් 2කි.
  1. පැවිදි සොයුරන් (මාරිස්ට් සහෝදරතුමන්ලා, ද ලා සාල් සහෝදරතුමන්ලා)
  2. පැවිදි සොයුරියන් (ශුද්ධ වූ පවුලේ පැවිදි සොයුරියන්, අපෝස්තලික කාර්මෙල් පැවිදි සොයුරියන්, යහපත් එඩේරාගේ පැවිදි සොයුරියන්, සුරදූත පැවිදි සොයුරියන්, දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ පැවිදි සොයුරියන්, සිරි කුරුස පැවිදි සොයුරියන් හා ඩොමිනිකාන පැවිදි සොයුරියන්)
- මේ සියලු දෙනා වේදහාර 3 ගනියි.
  1. දිළිඳුකම 2. කීකරුකම 3. ව්‍රත ශුද්ධිය
- ස්වර්ගයේ කිරීටය දිනා ගැනීමට වෙහෙසෙයි (1 කොරින්ති 9/24-27)
- පැවිදි හා පූජක ජීවිතයට දේව කැඳවීමක් ඇත්දැයි සොයා බැලිය යුතු බව
- පාසල්වල හා මීසම්වල සේවය කරන පැවිදි අයගේ කාර්යයන්ට උදව් විය යුතු බව
- පැවිදි ජීවිතයේ උතුම්කම අගය කළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

පෙළපොතේ 12වන පාඩම කියවා ''පැවිදි ජීවිතය'' පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පැවිදිවරුන්ට ගෞරවය කිරීමට ළමුන් හුරු කරවන්න.

## 13 වන පාඩම

## ගිහි කැඳවීම

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 7.3.4 : ගිහි ධර්මදූත සමිතියක ක්‍රියාකාරී සාමාජිකයෙක් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පොදු පූජකවරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් භාර ගැනීමට කැමැත්ත පල කරයි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මීසමේ ධර්මදූත කාර්යයන්ට උනන්දුවෙන් සහභාගි වෙයි.
- මීසමේ සමිති සමාගම්වලට දායක වෙයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

**පියවර 1**

- මීසමේ සමිති සමාගම් ගැන සාකච්ඡා කරමින් පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.
- මීසමේ සමිති සමාගම්වල නම්
  - පූජා උදව් සමිතිය
  - ගායනා කණ්ඩායම
  - ළමා ධර්ම දූත සමිතිය
  - තරුණ සමිතිය
  - මරිය හමුදාව
  - වින්සන් ද පාවුලා සමිතිය
  - තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය
- ධර්ම දූත ළමා සමාජයේ කුඩා දරුවන් සිටී
- තරුණ සමිතියේ හා කනිෂ්ඨ මරිය හමුදාවේ තරුණ අය සාමාජිකත්වය දරයි.
- මරිය හමුදාව හා වින්සන් ද පාවුලා සමිතිවල වැඩිහිටියන් සිටියි.

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - රදගුරුවරු, පූජකවරු, පැවිදිවරු හා තේවාචාරවරු හැර ප්‍රසාද ස්නාපනය ලැබූ සියලු දෙනාම ගිහියන් බව
    - ප්‍රසාද ස්නාපනය ලැබූ සියලු දෙනා පොදු පූජකවරය ලබන බව
    - නිල පූජකවරය, පූජකවරය දානය කිරීමෙන් ලැබෙන බව
    - පොදු පූජකවරය මගින් දිවැසිවර, පූජක හා එඬේරික කාර්යයන් ලැබෙන බව
    - දරුවන් වශයෙන් නිරත විය හැකි දිවැසිවර, පූජක හා එඬේරික කාර්යයන්
      දිවැසිවර කාර්යයන්
        - දේව වචනයට සාක්ෂි දැරීම
        - සත්‍යය ප්‍රකාශ කිරීම
    - පූජක කාර්යයන්
        - එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කිරීම
        - පූජා උදව් සමිතියට බැඳී සේවය කිරීම
    - එඬේරික කාර්යයන්
        - පාසල්වල නායකත්වය ගනිමින් සේවය කිරීම
        - මෙම කාර්යයන් ඵලදායී ව ඉටු කිරීමට සහාය වන සමිති සමාගම්
          *උදා :* ළමා ධර්ම දූත සමිතිය, පූජා උදව් සමිතිය, ගීතිකා කණ්ඩායම, ළමා ක්‍රියාකාරී වීරයෝ, කුඩා කිතුනු ඒකක, කනිෂ්ඨ මරිය හමුදාව, තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

කණ්ඩායම 1

පෙළපොතේ 13 පාඩම කියවා පොදු පූජකවරය තුළින් පැවරෙන දිවැසි, පූජක හා එඬේරික කාර්යයන් තුන අනුව කළ හැකි කාර්යයන් වෙන වෙන ම වගුගත කර නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

කණ්ඩායම 2

7 ශ්‍රේණියේ ඉගෙනුම් ලබන ඔබ පාසලේ හා මීසමේ දී පොදු පූජකවරය තුළින් පැවරෙන කාර්යයන් ඉටු කරන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

මීසමේ ඇති සමිති සමාගම්වලට බැඳී සේවය කිරීමට දරුවන් යොමු කරවන්න.

## 14 වන පාඩම

## ආශිර්වාදකාර බන්ධනය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 7.3.5 : ශුද්ධ වූ පවුලේ ආදර්ශය තුළ ජීවත් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ආශිර්වාදකාර බන්ධන පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුද්ධ වූ පවුලෙන් ආදර්ශ ගත යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ආදර්ශමත් පවුලක් ලෙස ජීවත් වෙයි.
- දෙමව්පියන්ගේ කටයුතුවලට සහාය වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර** 1

- ආශිර්වාදකාර බන්ධනය නමැති දේව ප්‍රසාද නිධානය දානය කරන පින්තූර සිසුන්ට ප්‍රදර්ශනය කර පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- ආශිර්වාදකාර බන්ධනය දේවස්ථානයේ දෙවියන් වහන්සේ ඉදිරියේ සිදු කරන බව
- ආශිර්වාදකාර බන්ධනය දිව්‍ය පූජාව තුළ දානය කරන බව
- දෙවියන් වහන්සේ ආශිර්වාදකාර බන්ධනය දී යුවලට ආශිර්වාද කරන බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - කිතුනු විවාහයේ ලක්ෂණ
    1. ඒකත්වය (එක් ස්වාමි පුරුෂයෙකුට එක් භාර්යාවක් ද, එක් භාර්යාවකට එක් ස්වාමි පුරුෂයෙක් ද පමණි)
    2. අඛණ්ඩභාවය (දික්කසාදයක් නැත)
  - විවාහක යුවල තම මුළු ජීවිතය පුරා ම (මරණය දක්වා ම) එකට ජීවත් වීම අඛණ්ඩභාවය යි.
  - විවාහය දෙවියන් වහන්සේ ස්ථාපිත කළ නිසා එය ශුද්ධ වූ බන්ධනයකි.

- ආශිර්වාදකාර බන්ධනය ගිවිසුමකි.
- දෙමාපියන්ගේ යුතුකම්
    - දරුවන්ට අවශ්‍ය ආදරය හා රැකවරණය ලබාදීම
    - දරුවන් ව හැකි විගස ප්‍රසාද ස්නාපනය කිරීම
    - දරුවන් කතෝලික විශ්වාසය තුළ ඇතිදැඩි කිරීම
    - දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම
    - කතෝලික ධර්මය විෂයයක් ලෙස උගන්වන පාසල්වලට දරුවන් ඇතුළු කිරීම
    - වගකීම් ඉටු කරන දරුවන් ලෙස, දරුවන් හදා වඩා ගැනීම
    - දරුවන්ගේ ශාරීරික, මානසික හා ආධ්‍යාත්මික අවශ්‍යතා ඉටු කිරීම
    - ශුද්ධ වූ පවුලෙන් ආදර්ශ අනුකරණය කිරීම
    - ආදරය, කරුණාව, ඉවසීම, අනෝන්‍ය සහයෝගය, උදව් කිරීම, ශුද්ධවන්තකම, කීකරුකම යනාදී ගුණාංග ශුද්ධ වූ පවුලෙන් ලැබෙන බව
    - ශුද්ධ වූ පවුල දෙවියන් වහන්සේගේ සැලැස්මට අනුව ජීවත් වූවා සේ අප ද එසේ කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, මාකර්
- ඇමුණුම 1
- ශුද්ධ බයිබලය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

කණ්ඩායම 1 : පෙළපොතේ 14වන පාඩම කියවා විවාහය පිළිබඳ තොරතුරු රැස් කර නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

කණ්ඩායම 2 : ශුද්ධ වූ පවුලෙන් ලබා ගත හැකි ආදර්ශ නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ශුද්ධ වූ පවුලේ ගුණාංග දරුවන් තුළ ඇති කිරීමට උදව් වන්න.

## 15 වන පාඩම

## මව්පියන්ට සංග්‍රහ කරමු

**නිපුණතාව** 4.0 : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 7.4.1 : තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- 4වන පනත පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- පාසල වෙනුවෙන් තම යුතුකම් නිසි ලෙස ඉටු කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දෙමාපියන්ට කීකරු ව ජීවත් වෙයි.
- වැඩිහිටියන්ට ගරු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ''ලේ කිරි කරලා'' ගීතිකාව දැක්වෙන පෝස්ටරය ප්‍රදර්ශනය කර සිසුන් සමග තාලයට ගායනා කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    - දෙමාපියන් තම දරුවන් වෙනුවෙන් කැපවෙන ආකාරය උදාහරණ සහිත ව විස්තර කිරීම
    - දෙමාපියන් වෙත දරුවන්ගේ යුතුකම්

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - දස පනතේ දෙවන කොටසේ පළමු පනත මව්පියන්ට සංග්‍රහ කිරීම
    - දෙවියන් වහන්සේට පසු ව අප වැඩිපුර ම ප්‍රේම කළ යුත්තේ දෙමාපියන්ටයි. මන්ද යත්, දෙවියන් වහන්සේගෙන් ලැබෙන ජීවිතය හා විශ්වාසය අපට ලැබී ඇත්තේ දෙමාපියන්ගෙන් ය.
    - දෙමාපියන්ට ආදරය කිරීම හා කීකරුවීම අපගේ යුතුකම බව
    - මෙම පනතින් කීකරුවීමට හා ආදරය කිරීමට නියම කෙරෙන වෙනත් අය (ආගමික නායකයන්, රාජ්‍ය නායකයන්, ගුරුවරුන්, වැඩිහිටියන්)

- දෙමාපියන් වෙනුවෙන් යුතුකම්
    - ගෙදර දොර වැඩ කටයුතුවලට උදව් කිරීම
    - ඔවුන්ගේ දුක් වේදනා අසනීපවල දී පිහිට වීම
    - ඔවුන් වියපත් වූ විට හුදකලා නොකර රැක බලා ගැනීම
- මීසම වෙනුවෙන් යුතුකම්
    - මිසම් භාර පියතුමාට ගරු කිරිම හා අවනත වීම
    - මීසමේ ඇති ගිහි අපෝස්තලික සේවාවලට බැඳී සේවය කිරිම
- පාසල වෙනුවෙන් යුතුකම්
    - තම පාසලේ විදුහල්පතිවරයාට, ගුරුවරුන්ට, ශිෂ්‍ය නායකයන්ට ගරු කිරීම හා කීකරුවීම
    - පාසල තුළ තමන්ට පැවරෙන කාර්යයන් තම ශක්ති ප්‍රමාණයෙන් ඉටු කිරීම
- රට වෙනුවෙන් යුතුකම්
    - පාලකයන් අගය කළ යුතු තැන්හි අගය කර ඔවුන්ගේ සේවය සාර්ථක කිරීම සඳහා යාච්ඤා කිරීම
    - තම වැටුපට පමණක් වහල් නොවී සේවය අවංකව ඉටු කිරීම

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි,
- ප්ලැටිග්නම්
- ඇමුණුම 1
- ''ලේ කිරි කරලා'' ගීතිකාව දක්වෙන පෝස්ටරය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

පෙළපොතේ 15වන පාඩම කියවා 4වන පනත පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා නිවසෙන් පිටත්වීමේ දී දෙමාපිය ආශිර්වාදය ලබා ගැනීමට යොමු කරවන්න.

## 16 වන පාඩම

## බොරු සාක්ෂි නොකියව

**නිපුණතාව** 4.0 : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම** 7.4.2 : සත්‍යගරුක පුද්ගලයෙක් වෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- සත්‍යගරුක සමාජයක් ගොඩනැගීම සඳහා දායක විය හැකි ආකාර පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සත්‍යය තුළ ජීවත් වීමේ දී හෘදය සාක්ෂියට කතා කිරීමට නිතර ම ඉඩදිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- බොරු කීම අත් හැර සත්‍යය කතා කරයි.
- සමාජය තුළ එකිනෙකාට අවංක වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර** 1

- ක්‍රියා 5/1-11 ඇසුරින් සුදුසු පරිදි දෙබසක් නිර්මාණය කර පෙර පුහුණුවකින් යුතු ව පන්තිය ඉදිරියේ රඟ දැක්වීමට සලස්වා පහත සඳහන් කරුණු ඉස්මතු වනසේ, සාකච්ඡාව මෙහෙවන්න.
  - අනනියස් හා සපීරා පිළිබඳ සිද්ධිය
  - මෙම සිද්ධිය තුළින් කඩවූ පනත

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - බොරුකීම මිනිසා කෙලසනු ලැබීමට හේතු වන බව (මතෙව් 15/10-12, 15/ 15-20)
  - බොරු කීම අත්හැර දමා සත්‍යය කථා කළ යුතු බව (එපීස 4/25)
  - අටවන දේව පනතින් නියම වන්නේ, සත්‍යවාදී වීමේ හා සත්‍යයට සාක්ෂි දැරීමේ ඇති අවශ්‍යතාව බව
  - සාතන් බොරුවේ පියා (ජොහාන් 8/44)

- වචනයෙන් හා ක්‍රියාවෙන් සත්‍යයට සාක්ෂි දැරිය යුතු බව
  (කතෝලික සභා ධර්මෝපදේශය- 2464)
- සත්‍යය විකෘති කිරීම පාපයකි.
- ඔබේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකිය යුතු බව (නික්මයාම 20/16)
- දිවුරුම් කඩ නොකර ස්වාමීන් වහන්සේට දුන් දිවුරුම් ඉටු කළ යුතු බව (ද්විතීය නීති සංග්‍රහය 5:20)
- බොරුව සුළු දෙයක් ලෙස පෙනුනත් එය බරපතල වරදක් බව
  (මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය (මතෙව් 15/10-12, 15/ 15-20; ජොහන් 8/44; ක්‍රියා 5/1-11; එපීස 4/25; නික්මයාම 20/16; ද්විතීය නීති සංග්‍රහය 5/20)
- කතෝලික සභා ධර්මෝපදේශය (2464)
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි,
- ජ්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

පෙළපොතේ 16වන පාඩම කියවා දස පනතේ අටවන පනත පිළිබඳ ව පහත සඳහන් කරුණු පදනම් කරගෙන නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

- බොරු කීම මිනිසා කෙලසනු ලැබීමට හේතු වන බව
- බොරු කීම අත්හැර සත්‍යය කතා කිරීම
- සත්‍යයට සාක්ෂි දැරීම හා සත්‍යය විකෘති නොකිරීම
- අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකීම
- දිවුරුම් කඩ නොකිරීම
- බොරුවේ පියා වන සාතන් ද ප්‍රතික්ෂේප කළ යුතු බව

**ගෙදර පරිසරයෙන්**

සැම විට ම සත්‍යය ප්‍රකාශ කිරීමට යොමු කරවන්න.

## 17 වන පාඩම

## සොරකම් නොකරව

**නිපුණතාව** 4.0 : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම** 7.4.3 : අන් අයගේ දේපළ ආරක්ෂා කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- 7වන පනතට අනුව ජීවත් විය යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- අවංක මාර්ගවලින් පමණක් වස්තුව ඉපැයිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සොරකම් කිරීමෙන් වැළකී සිටියි.
- අන් අයගේ දේපළ ආරක්ෂා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- සොරකම් කිරීම හා සම්බන්ධ පුවත්පත් සිරස්තල ඇතුළත් පෝස්ටරයක් පන්තියේ ප්‍රදර්ශනය කර පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- පුවත්පත් සිරස්තල තුළින් මතුවන කරුණු
- 7වන පනත කඩවන බව
- 7වන පනත නම් කිරීම
- 7වන පනතට අනුව නොකළ යුතු දේවල්

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - 7වන පනතින් තහනම් වනුයේ සොරකම් කිරීම, බලහත්කාරයෙන් ගැනීම අසාධාරණයෙන් ගැනීම හා අන්සතු දේපළ විනාශ කිරීම වේ
  - කිතුනුවන් ලෙස අන් අයගේ දේපළ ආරක්ෂා කිරීමට කුඩා කළ සිට ම පුරුදු පුහුණු විය යුතු බව

- වස්තුව ඉපැයිය හැකි සාධාරණ ක්‍රම (අවංක මාර්ග)
  (වැඩ කිරීමෙන්, මිලට ගැනීමෙන්, හුවමාරු කර ගැනීමෙන්, තෑගි හා උරුම වශයෙන් ලැබීම)
- ප්‍රයෝග, වංචනික ක්‍රියා හා අල්ලස් ගැනීම් මගින් සොරකම සිදුවන බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත්පත් සිරස්තල දක්වෙන පෝස්ටරය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි,
- ප්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- පෙළපොතේ 16වන පාඩම  කියවා දස පනතේ 7වන පනතට අනුකූල ව පහත සඳහන් කරුණුවලට අදාළ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා  සූදානම් වන්න.
  - 7වන පනතින් තහනම් කරන දේවල්
  - වස්තුව ඉපැයිය හැකි සාධාරණ ක්‍රම (අවංක මාර්ග)
  - සොරකම සිදුවන මාර්ග

**ගෙදර පරිසරයෙන්**

සොරකම් නොකිරීමෙන් යහපත් ආදර්ශයක් ලබා දෙන්න.

## 18 වන පාඩම

## අන් වස්තු ආශා නොකරව

**නිපුණතාව** **4.0** : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** **7.4.4** : ලද දෙයින් සතුටු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- 10වන පනතට අනුව ජීවත් විය යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- තණ්හා සිතුවිලි ක්‍රියාවට පෙරළෙන බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ලද දෙයින් සතුටු වෙයි.
- අන් අයගේ දේපළ ආරක්ෂා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 01 හි ඇති ගීතය ඩිමයි කොළයක ලියා සිසුන්ට ප්‍රදර්ශනය කර කැසට් රෙකෝඩරය ක්‍රියාත්මක කර එම ගීතයේ පළමු කොටස පමණක් සිසුනට ශ්‍රවණය කිරීමට සලස්වා ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - මෙම ගීතයෙන් ප්‍රකාශ වන පණිවිඩය
  - 10වන පනත නම් කිරීම
  - 10වන පනත කඩ වන බව
  - 10වන පනත අනුව නොකළ යුතු දේවල්

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - 7වන පනතින් බාහිර ක්‍රියාවන් ගැන
  - 10වන පනත අනුව තණ්හාව උපදවා ගැනීම පවා පාපයක් වන බව
  - තණ්හා සිතුවිලි ක්‍රියාවට පෙරළෙන බව ( මීකා 2/1-2)
  - තණ්හාව මුල් අගුණ පාපයක් වන බව (ක.ස.ධ. 2534-2540)

- තණ්හාවට, ලෝභයට හා මසුරුකමට විරුද්ධ ව අප සුපරීක්ෂාකාරී විය යුතු බව
- සියලු ම වස්තුවල හිමිකරුවාණන් දෙවියන් වහන්සේ බව
- ලද දේ ගැන දෙවිඳුන් ඉදිරියේ පැසසිය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ''සොර දෙටුවෙක් කස තැළුම් කකා'' නැමති ගීතය අඩංගු CD තැටියක්
- කැසට් රෙකෝඩරයක්
- ශුද්ධ බයිබලය (මීකා 2/1-2)
- කතෝලික සභා ධර්මෝපදේශය (2534-2540)
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

සොර දෙටුවෙක් කස තැළුම් කකා
දත් ගෙඩියට ගෙන යන ගමනේ
වදක බෙරේ දක සොරා ගන්ට එය
(කදිමයි ලොබ සිතුවාලූ) //
අනේ මෙහෙම තණ්හාවක්
අනේ මෙහෙම ආශාවක්
මිනිසුනි ලැබේ ද ඉන් සැනසීමක්

**ඇමුණුම 2**

- පෙළ පොතේ 17වන පාඩම කියවා දස පනතේ 10වන පනතට අනුව ජීවත් විය යුතු ආකාරය නිරූපනය කිරීමට නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ලද දෙයින් සතුටුවීමට පුරුදු පුහුණු කරවන්න.

## 19 වන පාඩම

## ජපමාල බැතිය

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 7.5.1 : නිවැරදි බැතියෙන් ජපමාලය උච්චාරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ජපමාලය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ජපමාල බැතිය අප ජීවිත ආරක්ෂා කරන බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පවුලක් ලෙස දිනපතා ජපමාලය උච්චාරණය කරයි.
- ජපමාල බැතිය සම්බන්ධයෙන් මීසමේ ඇති වැඩ සටහන්වලට උද්යෝගයෙන් සහාය වෙයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

**පියවර 1**

- පන්ති කාමරය ඉදිරියේ කුඩා මේසයක් මත මල් දමක් පැලඳූ මරිය තුමියගේ පිළිරුව හා දැල්වූ පහනක් තබා අභිරහස් සමග ජපමාල පන්තියක් උච්චාරණය කර පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡා කරන්න.
  - ජපමාලය උච්චාරණය කරන අනුපිළිවල හා එයට අදාළ යාච්ඤා
  - ජපමාලය උච්චාරණය කරන අවසථාවන්
  - පවුලක් ලෙස ජපමාලය උච්චාරණය කිරීමේ වැදගත්කම

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- ජපමාලයේ ඉතිහාසය
- ජපමාලය උච්චාරණයේ දී භාවිත කරන අභිරහස් වර්ග හතර, එයට අදාළ දිනයන් හා අභිරහස් 20

- ජපමාලය කියන අනුපිළිවෙල හා එයට අදාළ යාච්ඤා
  (අහෝ මාගේ ජේසුනි, මංගල්‍යස්තු රාජේස්වරියනි, සකල ගුණ සම්පන්න යන යාච්ඤා සිසුන්ගෙන් කටපාඩම් ගන්න)
- මළවුන්ගේ ජපමාලය කියන අනුපිළිවෙල හා එයට අදාළ යාච්ඤා
- විවිධ ප්‍රාර්ථනාවන්
  - ජේසු තුමන්ගේ දිව්‍ය හෘදයේ ප්‍රාර්ථනාව
  - දේවමාතා ප්‍රාර්ථනාව
  - සාන්ත අන්තෝනි මුනිතුමන්ගේ ප්‍රාර්ථනාව
  - සාන්ත ජූඩ් මුනිතුමන්ගේ ප්‍රාර්ථනාව
  - සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ ප්‍රාර්ථනාව
  - මළවුන්ගේ ප්‍රාර්ථනාව
- ජපමාලය නිවැරදි අනුපිළිවල අනුව උච්චාරණය කළ යුතු බව
- පවුලක් ලෙස දිනපතා ජපමාලය උච්චාරණය කළ යුතු බව
- අවස්ථානුකූල ව ජපමාලය හා ප්‍රාර්ථනාවන් භාවිත කළ හැකි බව

**ගුණාත්මක යෙදවුම්**

- පී. ස්ටැනිස්ලාවුස් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමාගේ ජපමාලය පොත
- ජපමාල අභිරහස් හා ප්‍රාර්ථනා ඇතුළත් පොතක්
- මල් දමක් පැළඳ වූ මරිය තුමියගේ ප්‍රතිමාව
- පහනක්
- ඩිමයිල්, A4 කඩදාසි
- පැලටිග්නම්
- සෑම සිසුවෙකුට ම ජපමාලය බැගින්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

1. කණ්ඩායම
   පී. ස්ටැනිස්ලාවුස් ප්‍රනාන්දු (නිමනි) පියතුමාගේ ජපමාලය පොත හෝ පෙළ පොතේ 19වන පාඩම කියවා ජපමාලයේ ඉතිහාසය මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
2. කණ්ඩායම
   ජපමාල අභිරහස් ඇතුළත් පොතක් ගෙන ජපමාලය උච්චාරණයේ දී අප භාවිත කරන මෝක්ෂ හා ආලෝකයේ අභිරහස් නිර්මාණාත්මක පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

3. කණ්ඩායම

ජපමාල අභිරහස් සහිත පොතක් ගෙන ජපමාලය උච්චාරණයේ දී අප භාවිත කරන සොම්නස් හා දොම්නස් අභිරහස් නිර්මාණාත්මක පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

4. කණ්ඩායම

මළවුන්ගේ ජපමාලය හා එය භාවිත කරන අවස්ථා සාකච්ඡා කර එම ජපමාලය උච්චාරණය කරන ආකාරය පන්ති කාමරයට ඉදිරිපත් කරන්න. (එක් ජපමාල පන්තියක් ප්‍රමාණවත්)

5. කණ්ඩායම

විවිධ අවස්ථාවන්හි උච්චාරණය කරනා ප්‍රාර්ථනාවන් සාකච්ඡා කර ඒවායේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න.

## ඇමුණුම 2
## ආලෝකයේ අභිරහස් පහ

### පළමුවන අභිරහස

යාච්ඤා කරම්හ

ආලෝකයේ මාතාවන් වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනී, ඔබගේ ශ්‍රී කුමාරයා ස්නාවක ජුවාම් තුමන්ගෙන් බෞතීස්ම ස්නාපනය ලැබූ මොහොතේ ශුද්ධ වූ ත්‍රිත්වයේ අභිරහස අනාවරණය වීමෙන් ස්වර්ගීය මහිමාලෝකයෙන් පූර්ණ වූ විභාගයට මේ දස ආරාධනා පන්තිය හේතු කොට ගෙන, අපටත් ශුද්ධ වු ත්‍රිත්වයේ අභිරහස අදහා ගැනීමට වරම් ලබා දෙනවා සොදේ.

### දෙවන අභිරහස

යාච්ඤා කරම්හ

ආලෝකයේ මාතාවන් වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනී, ඔබගේ ශ්‍රී කුමාරයා කානා නුවර විවාහ මංගල්‍යයේ දී ජලය මිදි රසට හැරවීමේ ප්‍රාතිහාර්යයෙන් උන් වහන්සේගේ දේව මහිමය දර්ශනය කිරීමෙන් අමන්දානන්දයට පත් වූ විභාගයට මේ දස ආරාධනා පන්තිය හේතු ොකට ගෙන, අපටත් ඔබගේ මැදිහත්කමින් දේව බලය අත්දකින්නට වරම් ලබා දෙනවා සොඳේ.

### තුන්වන අභිරහස

යාච්ඤා කරම්හ

ආලෝකයේ මාතාවන් වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනී, ඔබගේ ශ්‍රී කුමාරයා දේව රාජ්‍යය ළඟා වූ බව ජනතාවට පහදා දෙමින් ඔවුන් පශ්චාත්තාපයට කැඳවනවා දුක මිනිස් ගැලවීමේ කාර්ය ආරම්භ වූයේ යැයි ප්‍රීති ප්‍රමෝදයට පත් වූ විභාගයට මේ දස ආරාධනා පන්තිය හේතුකොට ගෙන අපටත් පශ්චාත්තාපය මගින් දේව රාජ්‍යය දිනා ගැනීමට වරම් ලබා දෙනවා සොදේ.

## සතරවන අභිරහස

යාච්ඤා කරම්හ

ආලෝකයේ මාතාවන් වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනී, ඔබගේ ශ්‍රී කුමාරයා අන්‍ය රූප විලාශ වූ මොහොතේ උන් වහන්සේ මොක්ෂ ශ්‍රී ප්‍රභාලංකාරය දර්ශනය වූ බව දන ස්වර්ගීය ප්‍රීතියෙන් ජ්වලිත වූ විභාගයට මේ දස ආරාධනා පන්තිය හේතු කොට ගෙන, අපටත් ස්වර්ගීය මහිමාලංකාරයෙන් පූර්ණ වී දේව දර්ශනය දිනා ගැනීමට වරම් ලබා දෙනවා සොඳේ.

## පස්වන අභිරහස

යාච්ඤා කරම්හ

ආලෝකයේ මාතාවන් වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනී, ඔබගේ ශ්‍රී කුමාරයා අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ දී තමන් වහන්සේගේ ශරීරය හා ශ්‍රී රුධිරය පූප හා මිදි යුෂ මඟින් අභිරහස්‍යමය දිව්‍ය භෝජනයන් කොට දානය කිරීමෙන් දේව ජනතාවගේ ආත්ම ගැලවීම සඳහට ම ස්ථිර වූයේ යැයි චිත්තානන්ද ප්‍රීතියට පත් වූ විභාගයට මේ දස ආරාධනා පන්තිය හේතු කොට ගෙන, අපටත් එම දිව්‍ය මාර්ගෝපකරණයෙන් ආත්ම ගැළවීම ලබා ගන්නට වරම් ලබා දෙනවා සොඳේ.

**ගෙදර පරිසරයෙන්**

ජපමාලය නිරතුරු ව ළඟ තබා ගැනීමට හුරු කරවන්න.

## 20 වන පාඩම

## නුවාන හා මංගල්‍යය

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 7.5.2 : ඵලදායී ලෙස දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සමරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේවස්ථානයේ මංගල සමය, සැබෑ ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගත යුතු කාලවකවානුවක් ලෙස පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මංගල සමයේ තම ජීවිතයේ ආධ්‍යාත්මික වර්ධනයක් ඇති කර ගනියි.
- දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යයේ පොදු කටයුතුවල දී සහයෝගය ලබා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ පළවන දේවස්ථානයක වාර්ෂික මංගල්‍යය පිළිබඳ දැන්වීමක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කර එය කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දී පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - සෑම වසරකට වරක් දේවස්ථාන මංගල්‍යය පැවැත්වේ.
  - කොඩි ගස ඔසවමින් සංකේතාත්මක ව මංගල්‍යය කටයුතු ආරම්භ වේ.
  - දේවස්ථාන මංගල්‍යයේ දී නුවන අටක්, සන්ධ්‍යා මෙහෙය හා මංගල්‍යය පූජාව පැවත්වේ.
  - දේවස්ථානය කැප කර ඇති සාන්තුවරයාගේ ප්‍රතිමාව රැගෙන භක්ති ආදරයෙන් වීදි සංචාරය කරනු ලබයි.
  - මීසම් වාසීන් සේ ම සැදැහැවතුන් එකමුතු ව ගෞරවාන්විත ව මෙම අවස්ථාවේ ක්‍රියා කරනු ලබයි.

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- දින දහයක රාමුවේ පසුබිම
- දේවස්ථානය කැප කළ ශුද්ධවන්තයා පිළිබඳ අවබෝධය
- දේවස්ථානයේ මංගල්‍යය පැවැත්වීමේ අර්ථය
- කොඩිගස එසවීමේ අරුත
- මංගල්‍ය සමයේ දී ආධ්‍යාත්මික දේවලට මුල්තැන දීම
- මංගල්‍යය නුවාන දිනවල දී දේව වචනය මෙනෙහි කිරීමට මූලිකත්වය දිය යුතු බව
- ඇඳහිල්ලෙන් හා භක්තියෙන් යුතු ව ප්‍රතිමා රැගෙන යන පෙරහැරට සහභාගි වීම
- මංගල්‍යය සමයේ දී කරන දානමය ක්‍රියා ඉතා අර්ථවත් ව කළ යුතු බව
- සැබෑ පැසුතැවිල්ලක් සඳහා මෙම කාලය භාවිත කළ යුතු බව
- ශුද්ධවන්තයාගේ මැදිහත්කම තුළ අපට වරප්‍රසාද ලැබෙන බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- දේවස්ථාන මංගල්‍යය පිළිබඳ පුවත්පත් දැන්වීම (ඥානාර්ථ ප්‍රදීපය) සහිත පෝස්ටරය
- ඇමුණුම 1
- ඩිමයි, හාෆ්ෂීට්, ප්ලැටිග්ලම්
- කිතුනු ගී පොතක්
- පාසලට ආසන්න ම දේවස්ථානය කැප කර ඇති ශුද්ධවන්තයාගේ ජීවිත කතාව ඇතුළත් පොතක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- කණ්ඩායම් අංක 01 - 20වන පාඩම කියවා දේවස්ථානයේ මංගල්‍යය පැවැත්වීමේ වැදගත්කම පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරන්න.
- කණ්ඩායම් අංක 02 - ඔබ පාසලට ආසන්න ම දේවස්ථානය කැප කර ඇති සාන්තුවරයාගේ ජීවිත කතාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.
- කණ්ඩායම් අංක 03 -මංගල්‍යය සන්ධ්‍යා මෙහෙයට හා මංගල්‍යය දින ගායනයට සුදුසු ගීතිකා 05ක් ලියා ඉන් එක් ගීතිකාවක් පන්ති කාමරය ඉදිරියේ ගායනා කර දක්වන්න.

**ගෙදර පරිසරයෙන්**

මංගල්‍ය කාලවකවානුවේ දී පවත්නා ජනවන්දනා හා භක්ති අභ්‍යාස පිළිවෙත් සඳහා දිනපතා පවුලක් ලෙස සහභාගි වන්නට හුරු කරන්න.

## 21 වන පාඩම

## සන්ධ්‍යා මෙහෙය හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 7.5.3 : ගෞරවයෙන් සන්ධ්‍යා මෙහෙයට සහභාගි වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- සන්ධ්‍යා මෙහෙය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ගෞරවාන්විත ව සන්ධ්‍යා මෙහෙයට සහභාගි විය යුතු බව පිළිගනියි.
- සන්ධ්‍යා මෙහෙයේ සැලැස්ම නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගනිමින් දෙවිඳුන් හා ගැඹුරු සබඳතාවක් ගොඩනගා ගනියි.
- සන්ධ්‍යා මෙහෙයේ කටයුතු සංවිධානයේ දී මීසම්වාසීන් හා සහයෝගයෙන් ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

**පියවර 1**

- සන්ධ්‍යා මෙහෙය අවස්ථාවක දී භාවිත කළ ගීතිකා ඇතුළත් පත්‍රිකාව බැගින් එක් එක් සිසුවාට ලබා දී එය නිරීක්ෂණයට අවස්ථාව දී පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.
    - දේවස්ථානයේ වාර්ෂික මංගල දිව්‍ය පූජාවට පෙර දින සන්ධ්‍යා මෙහෙය පැවැත්වේ
    - සන්ධ්‍යා මෙහෙය සුවිශේෂී ආකෘතියක් තුළ පැවැත්වේ
    - සන්ධ්‍යා මෙහෙයේ ආකෘතිය පිළිබඳ ව විමසීම
        - ගීතිකා තුනක් මෙනෙහි කිරිම
        - සුවිශේෂය
        - දේශනාව
        - මරිමව් උදාන ගීය
        - විශ්වාසකයින්ගේ යැදුම්
        - ස්වාමිවාක් ආරාධනාව (ස්වර්ගයේ වැඩි සිටින)
        - යාච්ඤාව
        - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය
- දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය මෙම මෙහෙය තුළ දී දානය කිරීම

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - යාම යැදුම් පිළිබඳ කෙටි හැඳින්වීමක්
  - යාම යැදුම ඒ නමින් හැඳින්වීමට හේතුව
  - යාම යැදුම කියන අවස්ථා
    - උදේ
    - මධ්‍යාහ්න
    - සවස
    - රාත්‍රී
  - දිනපතා පූජක පැවිදි අය යාම යැදුම කියවීම අනිවාර්ය බව
  - ගිහි ජනතාව සන්ධ්‍යා මෙහෙයේ දී යාම යැදුම යදින බව
  - උදේ සහ සවස යාම යැදුමේ ආකෘතිය
  - සන්ධ්‍යා මෙහෙයේ සැලැස්ම
  - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පවත්වන අවස්ථාවන්
    - මීසමේ වාර්ෂික මංගල්‍ය සන්ධ්‍යා මෙහෙය අවස්ථාවේ දී
    - එක් එක් මීසම්වල යොදා ගන්නා විශේෂ දිනයන්හි (පළමු සිකුරාදා දින, පළමු බ්‍රහස්පතින්දා දින)
    - විශේෂ අවස්ථාවන්හි (දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය, තේවත්තේ රෝගීන්ගේ මංගල්‍යය)
  - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයේ වැදගත්කම
  - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කළ අවස්ථාවන්හි දෙදණ නමා නමස්කාර කිරීමේ අවශ්‍යතාව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- සන්ධ්‍යා මෙහෙයක පිළිවෙත් සහිත පත්‍රිකා කිහිපයක් / පොත් පිංචක් (සිසුන් ගණන අනුව)
- සන්ධ්‍යා මෙහෙයක් අවස්ථාවේ ගත් පින්තූර
- ඇමුණුම 01
- ඩිමයි කොළ / බ්‍රිසිල් බෝඩ්
- ප්ලැටිග්නම්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

පෙළපොතේ 21 පාඩම කියවා පහත ක්‍රියාකාරකම්වල නිරත වන්න.

I. කණ්ඩායම

''යාම යැදුම්'' පිළිබඳ ව කෙටි හැඳින්වීමක් නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ii. කණ්ඩායම

සන්ධ්‍යා මෙහෙයක ආකෘතිය උචිත පින්තූර සමගින් පෝස්ටරයක් තුළින් නිර්මාණය කරන්න.

(මිනිත්තු 35)

**ගෙදර පරිසරයෙන්**

මීසමේ පැවැත්වෙන දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයට පවුලක් ලෙස සහභාගි වන්න.

## 22 වන පාඩම

### පාද නමස්කාරය

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 7.5.4 : පැමිණෙන දුක් වේදනා දරා ගැනීමට ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය පිටිවහලක් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පාද නමස්කාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- පාද නමස්කාරයට සහභාගිවීම තුළ ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සහභාගි විය හැකි බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- චතාරික සමය තුළ හැකි සෑම විට ම පාද නමස්කාරයට භක්තියෙන් සහභාගි වෙයි.
- පාද නමස්කාරය සංවිධානය කිරීමට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

**පියවර 1**

- සිසුන් සියලු දෙනා සමග සුදුසු ස්ථානයකට ගෙන ගොස් ''අම්ල පඬුර'' පොතෙහි සඳහන් වන පාද නමස්කාරයේ කැමති ස්ථානයක් මෙනෙහි කරන්න.
  පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- පාද නමස්කාරයේ ආකෘතිය
  - පාද නමස්කාරයේ ස්ථානය නම් කිරීම
  - ක්‍රිස්තුනි ඔබ වහන්සේට නමස්කාර කර ස්තුති ප්‍රශංසා කරමු.
    මක්නිසාදයත් ඔබ වහන්සේගේ ශ්‍රී කුරුසයෙන් ඔබ වහන්සේ ලෝකය ගලවා ගත් සේක.
  - මෙනෙහි කිරීම
  - යාච්ඤාව
  - ස්වාමිනී පාපි වූ අපට කරුණා කර වදාළ මැනව
    අපට කරුණා කර වදාළ මැනව
    මළාවූ ක්‍රිස්තියානීන්ගේ ආත්මයන් දේව දයාබර කමින් සමාදානයේ සැතපෙන ලද්දේවා!
    ආමෙන්
- ජේසුස් වහන්සේ ව මරණයට තීන්දු කරනු ලැබූ අවස්ථාවේ පටන් සොහොන් ගෙයි තැන්පත් කිරීම දක්වා වූ විශේෂ සිදුවීම්වලින් පාද නමස්කාරය නිර්මාණය වී ඇති බව

(මිනිත්තු 10)

පියවර 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - පාද නමස්කාරයේ සංක්ෂිප්ත ඉතිහාසය
  - ස්ථාන දාහතර පිළිබඳ හැඳින්වීම
  - එක් එක් ස්ථානයේ අනුපිළිවෙල
  - පාද නමස්කාරයේ දී අවශ්‍ය වන පිළිතුරු හා දේව කන්‍යා ගීතිකාව
  - පාද නමස්කාරය සඳහා අර්ථාන්විත ව සහභාගී වීමෙන් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියට පංගුකාරයන් විය හැකි බව
  - ජීවිතයේ දී අපට හමුවන දුක් වේදනා අභියෝග සතුටින් පිළිගැනීම
  - චතාරික සමයේ සෑම සිකුරාදා දිනක ම පාද නමස්කාරයට සහභාගි විය යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1
- අම්ල පඩුර පොත
- ලී කුරුසයක්
- පාද නමස්කාරයේ ස්ථාන 14 ඇතුළත් පින්තූර
- වර්ණ පෑන් / ප්ලැටිග්නම්
- බ්‍රිස්ටල් බෝඩ්
- A4 කොළ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | - | පෙළ පොතේ 22 පාඩම කියවා,''පාද නමස්කාරයේ ඉතිහාසය'' මැයෙන් බිත්ති පුවත් පතට සුදුසු ලිපියක් ලියන්න. (වචන 100 ප්‍රමාණවත් ය) |
| 2 කණ්ඩායම | - | පාද නමස්කාරයේ ස්ථාන දහහතර ඉදිරිපත් කරන පින්තූර අලවා ස්ථාන නම් කර පෝස්ටරයක් නිර්මාණය කරන්න. |
| 3 කණ්ඩායම | - | පාද නමස්කාරයේ ඔබ කැමති ස්ථානයක් සඳහා මෙනෙහි කිරීමක් සකස් කර එය නිර්මාණාත්මක ව පන්ති කාමරයට ඉදිරිපත් කරන්න. |

**ගෙදර පරිසරයෙන්**

ජීවිත ගමනේ පැමිණෙන දුක් කරදර ඉවසා දරා ගැනීමට දරුවන් හුරු කරවන්න.

## 23 වන පාඩම

## ශුද්ධ වූ පැය

**නිපුණතාව 5.0** : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 7.5.5** : ශුද්ධ වූ පැයට භක්තියෙන් සහභාගි වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ශුද්ධ වූ පැය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- භක්තියෙන් යුතු ව ශුද්ධ වූ පැය කිරීමෙන් ජේසුස් වහන්සේගේ වේදනාවලට අපට ද පංගුකාර විය හැකි බව පිළිගනියි.
- ශුද්ධ වූ පැය පිළිබඳ පොත් පිංචක් සකස් කරයි.
- හැකි සෑම විට ම ශුද්ධ වූ පැයට සහභාගි වෙයි.
- ශුද්ධ වූ පැයට අන් අය සහභාගි කරවා ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- සාම්ප්‍රදායික ශුද්ධ වූ පැය පොත් කිහිපයක් ළමුන් අතට ලබා දී පහත සඳහන් කරුණු පදනම් කරගෙන බුද්ධි කලම්බනයක් සිදු කරන්න.
- ශුද්ධ වූ පැයේ ආකෘතිය
  - ආරම්භක ගීතිකාව
  - ආරම්භක යාච්ඤාව
  - පළමුවෙනි පැය කාල
  - දෙවෙනි පැය කාල
  - ගීතිකාව
  - තුන්වන පැය කාල
  - සතරවෙනි පැය කාල
  - ගීතිකාව
  - අවසාන යාච්ඤාව
  - ගීතිකාව

- මෙම භක්ති අභ්‍යාසය පැය කාල බැගින් වූ කොටස් සතරකින් යුතු ව සිදු කරයි. (පළමු පැය කාල, දෙවන පැය කාල යනාදී වශයෙන්)

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- ශුද්ධ වූ පැයෙහි ඉතිහාසය
- කළ යුතු අවස්ථා
- කළ හැකි ආකාරයන්
- කිරීමේ පරමාර්ථ
    - ක්‍රිස්තුන් වහන්සේගේ මල් උයනේ යාච්ඤාවට අප ද පංගුකාර වීමට
    - විශේෂ අවශ්‍යතා වෙනුවෙන්
    - අපට තනි ව මුහුණ දිය නොහැකි ප්‍රශ්න හමුවේ ජේසු සමිඳුන්ගේ සහාය පැතීමට
- සාම්ප්‍රදායික ශුද්ධ වූ පැයෙහි අනුපිළිවෙල
- ජේසුස් වහන්සේගේ දුක් වේදනාවලට සහනය ලබා දීම සඳහා අප ද භක්තියෙන් යුතු ව ශුද්ධ වූ පැයට සහභාගි විය යුතු බව
- මහ බ්‍රහස්පතින්දා දින ශුද්ධ වූ පැයට සහභාගි වීම
- හැකි අවස්ථාවන්හි පවුලක් ලෙස ශුද්ධ වූ පැය නිවසේ දී සිදු කිරීමේ වැදගත්කම
- මීසම, කොට්ඨාස, කිතුනු ඒකක මගින් පවත්වනු ලබන ශුද්ධ වූ පැයට සහභාගිවීමේ අවශ්‍යතාව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ වූ පැය සහිත පොත් කිහිපයක් (එක් කණ්ඩායමට 2 බැගින්)
- ඇමුණුම 01
- ප්ලැටිග්නම්
- A4 කොළ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

23වන පාඩම හා ලබා දී ඇති ශුද්ධ වූ පැය පොත කියවා පහත කරුණු අන්තර්ගත කර කුඩා පොත් පිංචක් සකස් කරන්න.

- ශුද්ධ වූ පැයෙහි ඉතිහාසය
- ශුද්ධ වූ පැය කිරීමෙහි පරමාර්ථ
- සාම්ප්‍රදායික ශුද්ධ වූ පැය පවත්නා අනුපිළිවෙල

**ගෙදර පරිසරයෙන්**

ශුද්ධ වූ පැය අවස්ථාවේ භාවිත වන යාච්ඤා නිවැරදි ව, තාලානුකූල ව උච්චාරණය කිරීමට හුරු කරවන්න.

## 24 වන පාඩම

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීම හා දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 7.5.6 : දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට නිසි ගෞරවය දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ව බැහැදැකීම හා පෙරහැර පැවැත්වීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- හැකි සෑම අවස්ථාවක ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකිය යුතු බව පිළිගනියි.
- දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරයි.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීම තුළින් ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගනියි.
- දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර සංවිධාන කටයුතුවල දී සහයෝගය ලබා දෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ''ආ උතුම් මේ'' ගීතිකාව ඇතුළත් පත්‍රිකාවක් සෑම සිසුවෙක් වෙතට ලබා දී එම ගීතිකාව සාමූහික ව ගායනා කර පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයේ දී ගැයෙන ගීතිකාවකි.
  - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පවත්වන අවස්ථා
  - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දානය කිරීමේ දී අනුගමනය කරන පිළිවෙල
  - එම අවස්ථාවේ දී පියතුමා අඳින ඇඳුම
  - දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවේ දී අපගේ ඉරියව්
  - අපගේ ජීවිතයේ ප්‍රශ්නවලට පිළිතුරු උන් වහන්සේ තුළින් අපේක්ෂා කරයි.

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ව බැහැදකීමේ පරමාර්ථ
    - දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජීවමාන ජේසුස් වහන්සේට යාච්ඤා කිරීම
    - අපගේ යාච්ඤා ජීවිතය පෝෂණය කිරීමට
    - ජේසුස් වහන්සේ සමග ගැඹුරු සබඳතාවක් ඇති කර ගැනීමට
    - අපගේ ගෞරවාචාරය පුද කිරීමට
    - අපගේ ආධ්‍යාත්මික හා ලෞකික අවශ්‍යතා හමුවේ උන් වහන්සේ තුළින් සහනය පැතීමට
- එසේ කළ යුතු අවස්ථා
    - හැකි සෑම අවස්ථාවකදී ම
    - දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ඇති විට
    - දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පවත්වන විට
    - අපගේ අවශ්‍යතා සඳහා උන් වහන්සේගේ මැදිහත්කම ප්‍රාර්ථනා කරන විට
- දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරේ පරමාර්ථ
    - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ ආශිර්වාදය ග්‍රාමයට හා එහි වසන්නන්ට ලබාදීමට
    - අපගේ ගෞරවාදරය පුද කිරීමට
- දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරට සහභාගි විය යුතු අන්දම
    - පෙරහැරේ දී ගායනා කරන ගීතිකා හා යාච්ඤාවලට සහභාගි වෙමින්
    - කතාබහවලින් වැළකීමෙන්
    - පිළිවෙලකට ගමන් කිරීමෙන් (දෙදෙනා හෝ තිදෙනා බැගින්)
    - සරල චාම් වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන්
- පූර්ව සූදානම (දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර සඳහා)
    - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගෙන වීදි සංචාරය කරන මංගල රථය සූදානම් කිරීම
    - නියමිත යාච්ඤා හා ගීතිකා ඇතුළත් පත්‍රිකා මුද්‍රණය කිරීම
    - දේවස්ථානය හා වීදි මාර්ගය සැරසීම
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ඇති දෙව්මැදුරක හැසිරිය යුතු ආකාරය
    - නිශ්ශබ්දතාව රකිමින්
    - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දෙදණ හා හිස නමා ගෞරවය පුද කිරීමෙන්
    - සාමූහික හෝ පෞද්ගලික යාච්ඤාවල නිරත වීමෙන්
    - සංවර ලෙස දේවස්ථානය ඇතුළත ගමන් කිරීම
    - හැකි සෑම විට ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදකීමට දේවස්ථානය කරා පිය නැගිය යුතු බව
    - මීසමක් වශයෙන් සිදු කරනු ලබන දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවන් සංවිධානයට දායක වීම

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ආ උතුම් මේ ගීතිකාවේ පිටපත් (සියලු සිසුන් සඳහා)
- ඇමුණුම 01
- ප්ලැටිග්නම්
- ඩිමයි කොළ
- A4 කොළ
- බ්‍රිසිල් බෝඩ්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 24වන පාඩම කියවා පහත කරුණු ඇතුළත් වනසේ පෝස්ටරයක් නිර්මාණය කරන්න.

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදකින අවස්ථා
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ඇති අවස්ථාවක දේවස්ථානයේ හැසිරිය යුතු අන්දම
- දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර පවත්වන අවස්ථා
- දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරක දී හැසිරිය යුතු ආකාරය

**ආ උතුම් මේ ගීතිකාව**

ආ උතුම් මේ අභිරහස දෝත් මුදුන් දී වඳිමු
බැහැරවේ පුරාණ තේවා දන් පිදේ පිදුම් අමා
දුබල වූ ඉඳුරන්ට පිහිට වේ විශ්වාසය
දෙව් පියාට දෙව් පුතුන්ට වේ පසස් මඟුල් ගොස (ගෝසා)
වන්දනා ගරු විකුම් ද ආසිරි සිරිත් වේවා
මේ තුමන් කෙරෙන් නිකුත් වූ සා වැනුම් සුදත් මටා
කිතුනු ගී 355 (1995 මුද්‍රිත)

**ගෙදර පරිසරයෙන්** : දේවස්ථානයක් ඉදිරියෙන් යන විට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීමට දරුවන් යොමු කරවන්න

## 25 වන පාඩම

## වන්දනා ගමන්

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 7.5.7 : යෝග්‍ය ලෙස වන්දනා ගමන්වල නිරත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- වන්දනා ගමන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සංයමයකින් වන්දනා ගමන තුළ හැසිරිය යුතු බව පිළිගනියි.
- වන්දනා ස්ථාන කිහිපයක තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.
- දිව්‍ය පූජාවන් හා භක්ති අභ්‍යාසවල නිරත වෙමින් ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගනියි.
- වන්දනා ස්ථානවල දී සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- පෝස්ටර් ප්‍රමාණයෙන් සකසන ලද ලංකා සිතියමක ලංකාවේ ප්‍රධාන කිතුනු වන්දනා ස්ථානයන්හි ඡායාරූප එම වන්දනා ස්ථාන පිහිටි ප්‍රදේශවල අලවා සිසුන්ට ප්‍රදර්ශනය කර පහත කරුණු සාකච්ඡාවට ලක් කිරීම
  - සිතියමේ දක්වා ඇති වන්දනා ස්ථාන හඳුනා ගැනීම
  - එම වන්දනා ස්ථානවල මංගල්‍යවලට වාර්ෂික ව සැදැහැවතුන් සහභාගි වන බව
  - අපගේ ආධ්‍යාත්මික හා ලෞකික අවශ්‍යතා වෙනුවෙන් වන්දනා ගමන්වලට සහභාගි වන බව

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - වන්දනා ගමන් යාමේ පරමාර්ථ
    - සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට සාමූහිකව වන්දනා කිරීම සඳහා
    - ලැබුනා වූ වරප්‍රසාදවලට තුති පිදීමට

- තම ආත්මික හා ලෞකික අවශ්‍යතා වෙනුවෙන් දෙවිඳුන් හමුවේ මැදිහත් වන ලෙස ඉල්ලීමට (වන්දනාව සඳහා යන දේවස්ථානය කැප කර ඇති මුණිවරයාගෙන්)
- වන්දනා ස්ථාන හඳුනා ගැනීමට හා දැක බලා ගැනීමට
- වන්දනා ගමන්වල හැසිරිය යුතු ආකාරය
  - මත්පැන් වැනි දේවලින් වැළකීමෙන්
  - සංවර ඇඳුම
  - සිද්ධස්ථානය තුළ සිදු කරනා දිව්‍ය පූජාවන් හා භක්ති අභ්‍යාසයන්ට සහභාගි වීම
  - පොදු සම්පත් අරපරිස්සමෙන් භාවිතය හා බෙදා ගැනීම
  - ආචාරශීලීව කතා කිරීම
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වන්දනා ස්ථාන හා ඒවා පිළිබඳ තොරතුරු (මඩු, තලවිල, තේවත්ත, මාතර)
- විදේශීය ප්‍රධාන වන්දනා ස්ථාන හා ඒවා පිළිබඳ තොරතුරු (ශුද්ධ වූ දේශය, පාදුවා, ගෝව)

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වන්දනා ස්ථාන ලකුණු කළ සිතියම
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වන්දන ස්ථාන හා එයට අදාළ පින්තූර
- ඇමුණුම 01
- බ්‍රිසිල් බෝඩ්
- ප්ලැටිග්නම්
- A4 කොළ
- වර්ණ පැන්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 25වන පාඩම කියවා පහත ක්‍රියාකාරකම්වල නිරත වන්න.

1 කණ්ඩායම

- දේශීය වන්දනා ස්ථානවල තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.
  - සිද්ධස්ථානය පිහිටි ප්‍රදේශය
  - සිද්ධස්ථානයේ ආරම්භක ඉතිහාසය (කෙටියෙන්)
  - ජනතාව අතර ප්‍රචලිත වීමට හේතු (කෙටියෙන්)

2 කණ්ඩායම

- විදේශීය වන්දනා ස්ථානවල තොරතුරු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
  - සිද්ධස්ථානය පිහිටි ප්‍රදේශය
  - සිද්ධස්ථානයේ ආරම්භක ඉතිහාසය (කෙටියෙන්)
  - ජනතාව අතර ප්‍රචලිතවීමට හේතු (කෙටියෙන්)

**ගෙදර පරිසරයෙන්** : වන්දනා ගමන්වල ගරුත්වය රැකෙන ලෙස සහභාගි වන්න.

**විවිධ සහාය**

| | | |
|---|---|---|
| **කාර්යාලීය කටයුතු** | : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>කළමනාකරණ සහකාර<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | ඩයස් අමරසිංහ මහතා<br>කාර්යාල ආධාරක<br>ජාතික අධ්‍යාපන ආයතනය |